# වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 431 පරිච්ඡේදය

431 වන පරිච්ඡේදය

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

මියගිය ලංකා රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවනට හා අනාථ දරුවනට විශ්‍රාම වැටුප් ප්‍රදානය සඳහා සම්පාදනය කොට ඇති නීතිය සංශෝධනය කිරීමේ හා ඒකාබද්ධ කොට තහවුරු කිරීමේ ආඥාපනතකි.

(ජුනි 02, 1898)

1. මෙම ආඥාපනත "වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනත" නමින් හැඳින්වේ. කෙටි නම

2. විෂය හා අන්තර්ගතය විසින් පද සම්බන්ධයේ දී විරුද්ධ අර්ථයක් නොදෙන්නේ නම් මෙහි පහත දක්වන පද සහ යෙදුම් මෙම ආඥාපනතෙහි යෙදෙන තාක් මෙම ආඥාපනතෙන් ඒවාට දී ඇති අර්ථයන්ගෙන් යුක්ත වන්නේය. අර්ථ නිරූපණය

"නියමිත දිනය" යන්නෙන් ආණ්ඩුකාරවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කෙරෙන නිවේදනයකින් මෙම ආඥාපනතේ කාර්යයන් සඳහා නම් කරනු ලබන දිනය අදහස් කෙරේ. ගැසට් නිවේදනයේ දිනයට පූර්ව දිනයක් නියමිත දිනය ලෙස නම් කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා බලය ද නියමිත දිනය නම් කිරීමේ බලය තුල පවතින්නේය. (1947.11.2)

[1]යම් දායකයකු සම්බන්ධයෙන් "දායක මුදල් ගෙවීමේ උපරිම කාලසීමාව" යන්නෙන්, ඔහු දායකයකු බවට පත්වන දිනයෙන් පටන් ගෙන එසේ දායකයකු ලෙස නොකඩව අවුරුදු තිස්පහක් සම්පූර්ණ කරන දිනය හෝ දායකයකුව සිටිමින් ම ඔහුට වයස අවුරුදු හැටපහ සම්පූර්ණ වන දිනය යන දින දෙකෙන් කවර වූ හෝ කලින් එළඹෙන දිනයෙන් අවසන් වන කාලසීමාව අදහස් විය යුතු ය. එහෙත් අදාළ දිනයේ දී හෝ එදිනට පසුව, එම යෙදුම -

(අ) අදාළ දිනයට පෙර දායකයකු ලෙස නොකඩව අවුරුදු තිස්පහක් සම්පූර්ණ කර ඇති හෝ දායකයකුව සිටියදී ම වයස අවුරුදු හැටපහ ලබා ඇති හෝ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඔහු දායකයකු බවට පත් වූ දිනයෙන් පටන් ගෙන දායකයකු ලෙස නොකඩව අවුරුදු තිස්පහක් සම්පූර්ණ කරන දිනය හෝ ඔහුට වයස අවුරුදු හැටපහ ලබන දිනය යන දින දෙකෙන් කවර වූ හෝ කලින් එළඹෙන දිනය අවසන් වන කාල සීමාව ඉන් අදහස් විය යුතු ය;

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](ආ) රජයේ සේවයෙන් අස්වීමෙන් පසු 13 වන වගන්තිය හෝ 15 වන වගන්තිය හෝ ප්‍රකාර දායකයකු ලෙස දිගටම ක්‍රියා කරන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඔහු දායකයකු ලෙස පත් වූ දිනයෙන් පටන් ගෙන දායකයකු ලෙස නොකඩව අවුරුදු තිස්පහක් සම්පූර්ණ වන දිනය හෝ දායකයකු ලෙස සිටියදීම වයස අවුරුදු හැටපහ ලබන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන කවර වූ හෝ දිනයෙන් අවසන් වන කාලසීමාව ඉන් අදහස් විය යුතු ය ;

(ඇ) විශ්‍රාම වැටුප් මත රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දායකයකු වන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඔහු දායකයකු බවට පත් වූ දිනයෙන් පටන්ගෙන අදාළ දිනයට පෙරාතුව ම දිනයෙන් අවසන් වන කාලසීමාව ඉන් අදහස් විය යුතු ය ;

(ඈ) අදාළ දිනයේ දී දායකයකු වූ හෝ එම දින හෝ එම දිනට පසුව දායකයකු බවට පත්වන වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඔහු දායකයකු බවට පත් වූ හෝ පත්වන දිනයෙන් පටන්ගෙන ඔහු රජයේ සේවයෙන් අස්වන දිනයෙන් අවසන් වන කාලසීමාව ඉන් අදහස් විය යුතු ය ;

"රාජ්‍ය නිලධාරියා " යන්නෙන් හෝ යන්නට

(අ) මෙම ආඥාපනත සම්මත වන අවධිය වන විට ලංකාවේ රාජ්‍ය සේවයෙහි කිසියම් තනතුරක් දරමින් සිටින දරා සිටි හෝ සහ

1885 වර්ෂයේ අංක 20 දරණ ආඥාපනතේ විධිවිධාන යටතේ පිහිටුවා ඇති අරමුදලට සිය වැටුපෙන් හෝ විශ්‍රාම වැටුපෙන් හෝ දායක මුදල් ගෙවන කිසියම් අයෙකු,

(ආ) ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීමකින් විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශිත ලංකා රාජ්‍ය සේවයෙහි කිසියම් ස්ථිර නිලයක් ඉහත කී අවධියේ දරමින් සිටින හෝ ඉන් අනතුරුව පරිවාසිකව දරණ හෝ කිසියම් අයෙකු සහ (1947.2.11) (1948.2.8)

(ඇ) ඉහත ආකාරයේ රාජ්‍ය නිලධාරියෙකුට කරන ලද සේවාවන් වෙනුවෙන් ලංකාවේ රජයෙන් විශ්‍රාම වැටුපක් ලබන කිසියම් අයෙකු අදහස් කෙරේ. (1947.2.11)

එහෙත් කිසිදු නිලධාරි කාන්තාවක් මේ පදයට ඇතුලත් නොවේ.

[1]"අදාළ දිනය" යන්නෙන් මේ ආඥාපනතේ කාර්ය සඳහා අදාළ දිනය ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයකින් නියම කරනු ලබන දිනය අදහස් වේ;

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

"ආපසු ගෙවිය යුතු දායක මුදල" යන්නෙන් විශ්‍රාම වැටුපට හිමිකම් කියහැකි දරුවන් නොමැති වැන්දඹු පුරුෂයෙකු විසින් ඔහුගේ භාර්යාව හෝ භාර්යාවගෙන් අන්තිමයා හෝ මියගිය දිනය සහ ඔහුගේ දරුවාට හෝ දරුවන්ගෙන් බාලතමයාට හෝ විශ්‍රාම වැටුප් හිමිකම් නතර වූ දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයෙන් අනතුරුව මෙම ආඥාපනත යටතේ ගෙවා ඇති දායක මුදල අදහස් කෙරේ. (1947.2.11)

[1]"වැටුප" යන්නෙන් -

(අ) 1969 ඔක්තෝම්බර් මස 1 වන දිනට පෙර වූ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් දායකයා විසින් දරන ලද විශ්‍රාම වැටුප් හිමි තනතුරේ මූලික වැටුප අදහස් වන අතර දායකයාට ලැබිය හැකි හෝ ඔහු විසින් භුක්ති විඳිය හැකි යම් දීමනාවක් හෝ වෙනත් පඩිනඩි හෝ වෙනත් යම් වාසියක වටිනාකම ඇතුළත් නොවිය යුතු ය ;

(ආ) 1969 ඔක්තෝම්බර් මස 1 වන දිනට පසුව එහෙත් 1975 අප්‍රේල් මස 1 වන දිනට පෙර වූ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කරන ආකාරයට දායකයා විසින් දරන ලද විශ්‍රාම වැටුප් හිමි තනතුරේ, ඒකාබද්ධ වැටුපට අනුරූප වූ කල්පිත මූලික වැටුප අදහස් විය යුතු අතර දායකයා විසින් ලැබිය හැකි හෝ භුක්ති විඳිය හැකි යම් දීමනාවක් හෝ වෙනත් පඩිනඩි හෝ වෙනත් යම් වාසියක වටිනාකම ඇතුළත් නොවිය යුතු ය ;

(ඇ) 1975 අප්‍රේල් මස 1 වන දිනට පසුව වූ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් දායකයා විසින් දරන ලද විශ්‍රාම වැටුප් හිමි තනතුරේ ඒකාබද්ධ වැටුප සහ සියලු විශ්‍රාම වැටුප් හිමි දීමනා ඇතුළත් විය යුතු අතර ඒ තනතුර සම්බන්ධයෙන් යම් නිලධාරියකුට ලැබෙන යම් ගාස්තු හෝ වෙනත් යම් දීමනා ඇතුළත් නොවිය යුතු ය;

අරමුදල ව්‍යවස්ථාපිත වූ හැටි

3. 1885 හි අංක 20 සහ 1896 හි අංක 21 දරණ ආඥාපනත් වලින් නිර්මාණය කොට "වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල" නමින් අඛණ්ඩව පවත්වාගෙන එන ( මෙහි මින් මතු අරමුදල නමින් හැඳින්වෙන) යම් අරමුදලක් වේද එම අරමුදලේ දායක මුදල් වශයෙන් මෙහි මින්මතු නියම කෙරෙන ආකාරයෙන් ලැබෙන සියළුම මුදල් එම අරමුදලට ගිණිය යුත්තේය.

එසේ ලැබෙන අරමුදල් ද ඊට එකතුවන පොලිය ද මෙහි මතු කියැවෙන විධිවිධාන අනුව අරමුදල පවත්වාගෙන යාමට අවශ්‍ය වන වියදම් දැරීම සඳහා ද ;

අවලංගු කොට ඇති යම් යම් අණ පනත්වල විධිවිධාන අනුව සහ ඒවාට යටත් කොට වැන්දඹුවනට හා අනාථ දරුවනට දැනටමත් අරමුදල විසින් ගෙවනු ලබන විශ්‍රාම වැටුප් සහ මෙහි මතු දැක්වෙන විධිවිධාන අනුව හා ඒවාට යටත් කොට දැන් හා මතු දායකවන රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවනට හා අනාථ දරුවනට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ද යොදා ගත යුත්තේය.

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

4. (1) අතීත හෝ අනාගත දායක මුදල්, දඩ සහ පොලී ආදී වශයෙන් අරමුදලට අයත්වන සියළුම මුදල් ලංකාණ්ඩුවෙහි ආයෝජනය කළ යුත්තේය. අරමුදල පවත්නා තාක්කල් ලංකාණ්ඩුව විසින් එම මුදල් වලට පොලිය ගෙවිය යුත්තේය.

අරමුදලේ මුදල රජයේ ආයෝජනය කළ යුතු බව

(2) මෙහි මතු සලසා ඇති විධිවිධානයන්ට යටත්ව එම පොලියේ ප්‍රතිශතය අඩුකිරීම් වලින් තොරව සියයට හය ගණනේ විය යුත්තේය. (1947.2.11)

එතෙකුදු වුවත් 1920 ජනවාරි 01 දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය තුළ අඩු කිරීම්වලින් තොරව, වර්ෂයට සියයට අට ගණනේ විය යුත්තේය.

(3) සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වන දිනට පොලිය සෑදිය යුතු වන අතර වර්ෂය තුළ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ භාරයේ අරමුදලේ බැරට තිබෙන සාමාන්‍ය මාසික ශේෂය මත පොලිය ගණනය කළ යුත්තේය. (1947.3.11)

(4) මෙම වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධානයන් අනුව වාර්ෂිකව අරමුදලට ගෙවිය යුතු පොලී මුදල මෙම ආඥාපනතින් අරමුදලට පැවරී ඇති ගෙවීම් සියල්ලම ගෙවීමට ප්‍රමාණවත් නොවන බව ආණ්ඩුකාරවරයාට ඒත්තු ගිය විටෙක එතුමාගේ විධානයෙහි නියම කෙරෙන මුදලක් ලංකාවේ පොදු ආදායමෙන් අරමුදලට ගෙවන ලෙස අමාත්‍යවරයා විසින් නියම කළ යුත්තේය.

(5) මෙම වගන්තියෙහි ඉහත සඳහන් කළ විධිවිධානයන් යටතේ පොලිය වශයෙන් ගෙවන සියළුම මුදල් ද අමාත්‍යවරයාගේ විධානයෙන් ගෙවන සියළු මුදල් ද ලංකාවේ පොදු ආදායමෙන් ගෙවිය යුත්තේය. එම ගෙවීම් සියල්ල මෙයින් පොදු අරමුදලේ භාරයට පවරනු ලැබේ.

(6) මෙම ආඥාපනතෙහි නියමයෙන් අරමුදල විසින් කළ යුතු සියළු ගෙවීම් අවසානයේ අරමුදලේ ශේෂය ලංකාවේ පොදු ආදායමට ගෙවිය යුත්තේය. (1947.3.11)

[1]5. (1) (මෙහි මින් මතු මේ ආඥාපනතේ ''අධ්‍යක්ෂවරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා මේ ආඥාපනතේ සාමාන්‍ය පරිපාලනය භාරව කටයුතු කළ යුතු ය.

මේ ආඥාපනත පරිපාලනය කිරීම.

(2) මේ ආඥාපනත මඟින් අධ්‍යක්ෂවරයා වෙත පවරන ලද හෝ නියම කරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ කර්තව්‍යයක් හෝ කාර්යයක් ඉටු කිරීමට ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් යම් නිලධරයකුට බලය දෙනු ලැබිය හැකි ය.

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](3) 1906 මාර්තු මස 14 වන දින හෝ එදිනට පෙර පත් කරන ලද රජයේ නිලධරයන් සම්බන්ධයෙන් දෙසැම්බර් මස තිස් එක් වන දිනට පෙරාතුව ම වූ මාස දොළහක කාලසීමාව තුළ මේ ආඥාපනත ප්‍රකාර ලබන ලද සහ ගෙවනු ලැබූ සියලු මුදල් පිළිබඳ සත්‍ය ගිණුමක් සෑම වර්ෂයක ම මැයි මස තිස් එක් වන දින හෝ එදිනට පෙර පිළියෙළ කරනු ලැබීමට අධ්‍යක්ෂවරයා විසින් සැලැස්විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පිළියෙළ කරනු ලැබූ ගිණුම විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු අතර ඒ ගිණුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

6. අරමුදලේ කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ සියළු වියදම් පියවීම සඳහා අවශ්‍ය විය හැකි මුදල් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් වරින් වර අධ්‍යක්ෂවරයා වෙත අරමුදලෙන් ලබාදිය යුත්තේය.

අරමුදලේ කළමනාකරණ වියදම්

[2]7. (1) මේ පනත යටතේ කරනු ලැබිය යුතු යැයි නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ, නියෝග සෑදීමට බලය දෙනු ලැබ ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය යුතු බව.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එකී පළ කිරීමේ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට බලපැවැත්විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම, එසේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොවූ සෑම නියෝගයක් ම එය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට අගතියක් නොවන පරිද්දෙන් එකී අනනුමතයේ සිට අවලංගු වූ ලෙස සැලකිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් අවලංගු වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

[1]8. (1) (අ) යම් මාසයක් සඳහා මුළු වැටුපට හෝ විශ්‍රාම වැටුපට අඩු මුදල් ප්‍රමාණයක් වැටුප හෝ විශ්‍රාම වැටුප ලෙස රජයේ නිලධරයකුට ලැබුණ ද නැතහොත් වැටුප හෝ විශ්‍රාම වැටුප ලෙස කිසිම මුදල් ප්‍රමාණයක් නොලැබුණ ද, මේ ආඥාපනත ආරම්භයේ සිට සහ ඉන්පසුව 1975 මාර්තු මස 31 වන දින දක්වා අවස්ථාවෝචිත පරිදි සෑම රජයේ සේවකයෙකුගේ ම මුළු වැටුපෙන් හෝ මුළු විශ්‍රාම වැටුපෙන් සියයට හතරක මාසික අඩු කිරීමක් කළ යුතු ය.

---

[1]1981 ජුලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[2]2010 අගෝස්තු මස 20 වැනි දින 2010 අංක 08 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](ආ) යම් මාසයක් සඳහා මුළු වැටුපට අඩු මුදල් ප්‍රමාණයක් වැටුප ලෙස රජයේ නිලධරයකුට ලැබුණ ද නැතහොත් වැටුප ලෙස කිසිම මුදල් ප්‍රමාණයක් නොලැබුණ ද, 1975 අප්‍රේල් මස 1 වන දින සිට සහ ඉන්පසුව සෑම රජයේ නිලධරයකුගේ ම ඒකාබද්ධ වැටුපෙන් අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි සියයට ප්‍රමාණයක මාසික අඩු කිරීමක් කළ යුතු ය.

(ඇ) 1975 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වී අදාළ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, යම් රජයේ නිලධරයකු රජයේ සේවයෙන් විශ්‍රාම ගිය මාසය සම්බන්ධයෙන් අඩු කරන ලද මුදල් ප්‍රමාණයට සමාන මාසික අඩු කිරීමක් හෝ රජයේ නිලධරයකු ස්වකීය විශ්‍රාම වැටුපෙන් දායක මුදල් ගෙවීමට කැමති වන අවස්ථාවක අඩු නොකරන ලද විශ්‍රාම වැටුපෙන් සියයට හතරක අඩු කිරීමක් ඒ විශ්‍රාම වැටුපෙන් සියයට හතරක අඩු කිරීමක් ඒ විශ්‍රාම වැටුපෙන් අඩු කළ යුතු ය.

> [1](1අ) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද අදාළ දිනයේ දී හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සම්බන්ධයෙන් රජයේ නිලධරයකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුපෙන් , එම උපවගන්තියේ සඳහන් මාසික අඩු කිරීමක් නොකළ යුතු ය.'' ;

[1](2) (1) වන උපවගන්තියෙහි සඳහන් අඩු කිරීම, දායකයන්ගේ වැටුපෙන් සහ විශ්‍රාම වැටුපෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් හෝ ක්‍රවුන් ඒජන්තවරුන් විසින් කරනු ලබන ගෙවීම්වල දී වැටුප සහ විශ්‍රාම වැටුප ගෙවීම කරනු ලබන සෑම අවස්ථාවක දී ම ඒ ක්‍රවුන් ඒජන්තවරුන් විසින් හෝ කළ යුතු අතර, එම මුදල ''වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල'' ට බැර කළ යුතු ය :

එසේ වුවද පසුව සඳහන් අවස්ථාවේ දී ඒ අඩු කිරීම ශ්‍රී ලංකාවේ සේවා නියුක්තව සිටිය විට දී ඒ දායකයාට ක්‍රවුන් ඒජන්තවරුන් විසින් රුපියල්වලින් ගෙවිය යුතු මුළු වැටුප මත හෝ ඒ දායකයා ශ්‍රී ලංකාවේ නේවාසික නම් ඔහුට රුපියල්වලින් ගෙවිය යුතු විශ්‍රාම වැටුප මත ගණනය කොට අඩු කිරීම කළ යුතු අතර එංගලන්තයේදී ඒ දායකයාට ඒ වැටුප හෝ විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම් ඇති අනුප්‍රමාණයට ගණන් බලන ලද ඒ වැටුපෙහි නැතහොත් විශ්‍රාම වැටුපෙහි රුපියල්වලින් ඉතිරි මුදලට සමාන ස්ටර්ලින් මුදලක් ක්‍රවුන් ඒජන්තවරුන්ගෙන් ලබා ගැනීමට ඒ දායකයාට හිමිකම් ඇත.''

---

[1]1981 ජුලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

(3) තම වැටුපෙන් [1]මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් අඩු කිරීම කර නොමැති අවස්ථාවක, සෑම රජයේ නිලධරයකු විසින්ම, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තමා විසින් ගෙවනු ලැබීමට නියම කරනු ලබන මුදලක්, තම වැටුප හෝ විශ්‍රාම වැටුප තමාට ලැබීමෙන් පසු දින පහළොවක් ඇතුළත භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට හෝ ක්‍රවුන් ඒජන්තවරුන්ට ගෙවිය යුතුය ; නැතහොත් යම් රජයේ නිලධරයකු වැටුප් නොමැතිව නිවාඩු ලබා සිටින අවස්ථාවක ඒ රජයේ නිලධරයා විසින්, ඒ නිවාඩු පවත්නා කාලයේ දී එක් එක් සහ සෑම මාසයක දී ම පහළොස් වන දිනට පෙර, ඔහු නිවාඩු නොලබා සිටියේ නම් (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ ඔහු විසින් ගෙවිය හැකිව තිබුණ මුදලට සමාන මුදලක් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට හෝ ක්‍රවුන් ඒජන්තවරුන්ට ගෙවිය යුතු ය.

යම් රාජ්‍ය නිලධාරියෙකු වැටුප් නැතිව නිවාඩු පිට සිටින්නේ නම් එසේ නිවාඩු පිට සිටින කාලය තුළ සෑම මාසයකම 15 වන දිනට ප්‍රථම, ඔහු නිවාඩු නොලබා සිටියේ නම් ලැබිය හැකිව තිබුණු මාසික පූර්ණ වැටුපේ සියයට හතරකට සමාන මුදලක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත හෝ රාජ්‍ය නියෝජිතයන් වෙත ගෙවිය යුත්තේය. මෙම උප වගන්තියේ විධිවිධානයන් අනුව අයවිය යුතුව තිබෙන හිඟ දායක මුදල් ද 1896 හි අංක 21 දරණ ආඥාපනතේ වගන්ති අනුව අයවිය යුතුව තිබෙන හා ගෙවිය යුතුව තිබෙන හිඟ දායක මුදල් සියල්ලද රාජ්‍ය නිලධාරියෙකුගෙන් අරමුදලට අයවිය යුතුව තිබෙන ණය මුදලක් සේ සැලකිය යුතු අතර එම ණය මුදල වර්ෂයට සියයට හයේ හෝ නියමිත දිනයට පසුව වර්ෂයට සියයට හතරේ හෝ පොලියකුත් සමඟ වහාම හෝ අධ්‍යක්ෂවරුන් විසින් නියම කෙරෙන වාරික වලින් හෝ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත හෝ රාජ්‍ය නියෝජිතයන් වෙත හෝ රාජ්‍ය නිලධාරියා විසින් ගෙවිය යුත්තේය.

අධ්‍යක්ෂවරුන්ගේ හෝ ඔවුන්ගෙන් කවර දෙනෙකුගෙන් හෝ ලැබෙන ලිඛිත නියෝගයක් මත භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් හෝ රාජ්‍ය නියෝජිතයන් විසින් හෝ එබඳු රාජ්‍ය නිලධාරියෙකුට ලැබිය යුතු හෝ ලැබෙන්නට ඇති හෝ ගෙවිය යුතු හෝ යම් මුදලක් වෙතොත් එම මුදලෙන් මුළු ණය මුදලම හෝ ඉන් කොටසක් අයකොට ගත යුත්තේය. එබඳු කිසිම ණයක් සම්බන්ධයෙන් තහනම් නියෝග ආඥාපනතේ විධිවිධාන අදාළ නොවන්නේය.

[19]. (1) (2) වන උපවගන්තියේ විධිවිධානයන්ට යටත්ව, 8 (1) වන වගන්තියේ සඳහන් අඩු කිරීම, රජයේ නිලධරයකු ඔහුට වයස අවුරුදු හැටපහ ලබන තුරුම රජයේ සේවයේ

අඩු කිරීම කළ යුතු කාල සීමාව

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1]යෙදී සිටියහොත් ඒ දක්වාම ඔහුගේ වැටුපෙන් අඩු කළ යුතු අතර ඒ දිනයෙන් එය අවසන් විය යුතු ය ; එසේම නිලධරයකු අවුරුදු තිස්පහක් එක දිගට අඩු කිරීමට භාජනය කරනු ලැබීමෙන් පසුව ද ඒ අඩු කිරීම අවසන් විය යුතු ය.

(2) (අ) අදාළ දිනයේ දී රජයේ සේවයේ සිටියදීම දායකයකු වන ; හෝ

(ආ) එම දිනයේ දී හෝ එදිනට පසු දායකයකු බවට පත්වන

රජයේ නිලධරයකුගේ වැටුපෙන් 8 (1) වන වගන්තියේ සඳහන් අඩු කිරීම ඔහු රජයේ සේවයේ සිටින තාක් කල් දිගටම කළ යුතු අතර ඔහු රජයේ සේවයෙන් අස්වන දිනයේ දී එය අවසන් විය යුතු ය.

10. කුමන කරුණක් හෝ හේතු කොට ගෙන යම් රාජ්‍ය නිලධාරියෙක් රාජ්‍ය සේවයට අයත් කෙනෙකු වීම නතර වී විශ්‍රාම වැටුප් මත විශ්‍රාම ගතහොත් එසේ විශ්‍රාම ගත් දිනයෙන් පටන් ගෙන අවකරණය නතර විය යුතු දිනය වන අවුරුදු හැට පහ පිරෙන දිනය වන තෙක් හෝ අවකරණයට භාජනය වී අවුරුදු තිස්පහ පිරෙන දිනය වන තෙක් ඔහුගේ වැටුපෙන් ගෙවන සියයට හතරේ මාසික අවකරණයට අමතරව කිසිදු දායක මුදලක් ගෙවන ලෙස ඔහුට නියම නොකළ යුත්තේය.

විශ්‍රාමිකයෙකුගෙන් 4% වඩා අය නොකළ යුතු බව

11. සාමාන්‍ය දීමනා කපා හැරීමෙන් හෝ විශ්‍රාම වැටුප් මත විශ්‍රාම යාමෙන් හෝ රාජ්‍ය නිලධාරියෙකුගේ වැටුප අඩු වූ කවර අවස්ථාවකදී වුවද ඔහුට එසේ වැටුප් අඩු වීමට පෙර ලබමින් සිටි වැටුප මත එම වගන්තිය හා කොන්දේසි වලට යටත්ව වැඩි වැටුප අඛණ්ඩව ලබමින් සිටින්නෙකු සේ, අරමුදලට දායක මුදල් ගෙවීමට කැමැත්ත පළ කළ හැක්කේය. එම නිලධාරියා වැඩි වැටුප මත දායක මුදල් දිගටම ගෙවීම තෝරා නොගෙන අඩු වැටුප හෝ විශ්‍රාම වැටුප මත දායක මුදල් ගෙවීම කළහොත් ඔහුගේ වැන්දඹුවට හෝ දරුවනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප,නිලධාරියාගේ වැටුප අඩු නොවී වැඩි වූයේ නම් වැඩිවිය හැකිව තිබුණු ප්‍රමාණයට සමානව අඩුවිය යුත්තේය.

ආදායමට අඩු වුවත් දායක මුදල් අඩු නොකොට ගෙවිය හැකි බව

12. මෙම ආඥාපනතෙහි 11 වන වගන්තිය අනුව වැඩි වැටුප මත අරමුදලට දායක වීමට යම් නිලධාරියෙකු කැමැත්ත පළ කරන්නේ නම් ඒ සඳහා අයිතිය ලැබී සය මසක් ඇතුළත එසේ කළ යුත්තේය. ඒ අවසාන කැමැත්ත පළ කිරීම විය යුත්තේය.

වැඩි වැටුප මත දිගටම දායක වීමට කැමැත්ත පළ කළ යුතු බව

[1](ආආ) මිය ගොස්, ඔහු මියයාමෙන් පසු ඔහුගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කරනු ලබයි නම්, හෝ

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, 1957 ජනවාරි මස 24 වන දින සිට බලපවත්වන ලෙස සැලකිය යුතු ය.

[1]1981 ජුලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

13. (1) අවිවාහකයෙකු නොවන රාජ්‍ය නිලධාරියෙකු යම් දිනෙක විශ්‍රාම වැටුප් රහිතව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන හෝ වෙනත් විධියකින් හෝ ඉවත් වන්නේ නම් ඔහුද අවිවාහක වූවත් නොවූවත් අරමුදලට දායක වෙමින් සිටින යම් රාජ්‍ය නිලධාරියෙකු ඔහු දරණ තනතුරෙන් ඉවත් කොට විශ්‍රාම වැටුප් රහිත තනතුරකට මාසික හෝ වාර්ෂිකව රේට් ගණන් අනුව ගණන් බලා ගෙවනු ලබන වැටුපක් මත හෝ දෛනික රේට් ගණන් අනුව ගෙවනු ලබන වැටුපක් මත හෝ යම් දිනක පත්කරනු ලබන්නේ නම් ඔහුද එදිනට පෙර ඔහු මාසිකව දායක වෙමින් සිටි මුදලම එදිනට පසුව ද අරමුදලට ගෙවීමට කැමති නම්, ඒ බව එම තනතුරට පත් වූ දින සිට මාස හයක් ඇතුළත හෝ විශේෂ හේතූන් මත අධ්‍යක්ෂවරුන් විසින් දෙන ලද යම් කාලසීමාවන් ඇතොත් එම කාලසීමාව තුළදී හෝ ප්‍රකාශ කළ යුත්තේය. ඔහු එසේ තෝරාගත්තේ නම් එදිනට ඔහු කෙරෙහි බලපෑ වගන්ති හා කොන්දේසි මතම එසේ දායක මුදල් ගෙවීම කරගෙන යාමට ඔහුට හැක්කේය. නිලධාරියා දායක මුදල් ගෙවීම නතර කොට තිබෙන අයෙකු හෝ ඔහුගෙන් අරමුදලට අයවිය යුතුව තිබෙන යම් දායක මුදලක් සය මාසයක සිට ගෙවා නැති අයෙකු නම් ඔහුගේ මරණින් පසු වැන්දඹුවට හෝ වැන්දඹුවට හා දරුවනට හෝ ප්‍රස්ථානුකූලව, ඔහුගේ මරණය වූ දිනට හෝ දායකත්වය නතර කළ දිනට උපයා ගෙන ඔහුගේ නමින් අරමුදලේ තිබෙන පොලිය පදනම් කොට මෙහි මතු දැක්වෙන වගු අනුව ගණනය කළ විශ්‍රාම වැටුපක් පමණක් ලැබිය හැක්කේය.

(1953 හි 3.33)

(1947.7.11)

[1](2) මේ ආඥාපනත යටතේ අදාළ දිනයේ දී හෝ එදිනට පසුව දායකයකු වන යම් තැනැත්තකුට, (1) වන උපවගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

[2]එසේ වුව ද, අදාළ දිනයේ දී හෝ ඉන්පසුව රාජ්‍ය සේවයට ඇතුළත් වූ (1) වන උපවගන්තිය යටතේ විශ්‍රාම යාමකට හෝ ඉවත් කිරීමට පෙරාතුව වසර දහයක සේවාවක් සම්පූර්ණ කොට ඇති යම් රාජ්‍ය නිලධරයකු (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රතිලාභවලට සුදුසුකම් ලැබිය යුතු ය.

14. 11 වන හා 13 වන වගන්තිය යටතේ කැමැත්ත ප්‍රකාශ කිරීමේ අයිතිය පාවිච්චි කළ යුතු අයෙකු සිහි විකල ගතිය නිසා ආඥාපනතේ නියම කොට ඇති කාල සීමාව තුළදී එම කැමැත්ත ප්‍රකාශ කිරීමට අපොහොසත් වූ විටක ඔහු වෙනුවෙන් එම කැමැත්ත එම කාල සීමාව තුළදී ප්‍රකාශ කිරීමට සුදුසු හා නිසි අයෙකු ලෙස අධ්‍යක්ෂවරුන් විසින් සලකනු ලබන පුද්ගලයෙකු අධ්‍යක්ෂවරුන් විසින් පත්කරනු ලැබිය හැක්කේය.

සිහිමද අයගේ අයිතීන් රැකීමට වෙන අයෙකු පත් කළ හැකි බව

(1954.2.45)

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[2]2010 අගෝස්තු මස 20 වැනි දින 2010 අංක 08 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

කිරීටය යටතේ ඇති වෙනත් රැකියාවලට මාරුකොට යැවෙන නිලධාරීන්

15. (1) මෙම ආඥාපනත සම්මත වීමට පෙර මාරුකොට යවනු ලැබූ අවිවාහක නිලධාරියෙකු හැර අනෙක් නිලධාරියෙකු විසින් හෝ මෙම ආඥාපනත සම්මත වීමෙන් පසුව මෙම රජයේ සේවයෙන්, කිරීටය යටතේ ඇති, වෙනත් යම් තනතුරකට මාරු කොට යැවෙන නිලධාරියෙකු විසින් හෝ තවදුරටත් මෙම රජයේ සේවයෙහි යෙදී සිටින්නෙකු සේ එදා මාරුකොට යවන ලද දිනයේ ලැබූ වැටුප මත එම වගන්ති හා කොන්දේසි මතම මේ රජයේ සේවය නතර වූ දින සිට ද අඛණ්ඩව දායක මුදල් සය මසකින් නොගෙවූ අයෙකු හෝ වී නම් ඔහුගේ මරණින් පසුව ඔහුගේ වැන්දඹුවට, හෝ වැන්දඹුවට හා දරුවන්ට හෝ ප්‍රස්ථාවානුකූලව, ඔහුගේ මාරුව සිදුවූ දින හෝ දායකකම නතර වූ දින හෝ වන විට ඔහු විසින් අරමුදලේ ඔහු නමින් උපයා ගෙන ඇති පොලිය පදනම් කොට ගෙන මෙහි මතු දැක්වෙන වගු අනුව ගණනය කළ විශ්‍රාම වැටුපක් ලැබිය යුත්තේය.

එතෙකුදු වුවත් නිලධාරියා මාරුකොට යවන ලද්දේ නියමිත දින හෝ ඊට පසු දිනක නම් ඔහු මාරුකොට යවනු ලැබූ දිනයේ සිට මාස හයක් ඇතුළත හෝ විශේෂ හේතූන් නිසා අධ්‍යක්ෂවරුන් විසින් දෙන ලද යම් කාලසීමාවක් ඇතොත් එම කාලසීමාව ඇතුළත හෝ ඔහු විසින් එසේ තවදුරටත් දායක මුදල් ගෙවීමට කැමැත්ත පළකළේ නැතිනම් මෙම වගන්තියේ ඉහත දැක්වූ විධිවිධානයන් අනුව දායක මුදල් තවදුරටත් ගෙවීමට ඔහු හිමිකම් නොලැබිය යුත්තේය. (1947.7.11)

[1](2) මේ ආඥාපනත යටතේ අදාළ දිනයේ දී හෝ එදිනට පසුව දායකයකු වන යම් තැනැත්තකුට, (1) වන උපවගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

13 වන හා 15 වන වගන්ති මත දායක මුදල් ගෙවිය හැකි බව

(1947.9.11)

16. 13 වන හෝ 15 වන වගන්ති අනුව එක් එක් මාසය සඳහා ගෙවිය යුතු දායක මුදල ඊළඟ මාසයේ 15 වන දිනට ප්‍රථම ගෙවිය යුත්තේ ය. එදිනට පෙර නොගෙවෙන ලද දායක මුදල් හිඟදායක මුදල් සේ සැලකිය යුත්තේය. එබඳු හිඟ දායක මුදල් වර්ෂයට සියයට හයේ වැල් පොළියක් සමඟ හෝ නියමිත දිනට පසුව නම් සියයට හතරේ වැල් පොළියක් සමඟ ගෙවිය යුත්තේ හෝ අය කොට ගත යුත්තේ හෝ වෙයි.

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

17. (1) ලංකාවේ රාජ්‍ය සේවයේ තනතුරක් දැරීම නතරවීමෙන් පසුව ද මෙම ආඥා පනතේ 13 හා 15 වන වගන්ති යටතේ අරමුදලට දායක මුදල් ගෙවූ නිලධාරියකු විසින් මාස හයකින් දායක මුදල් ගෙවා නොමැති නම් එම දායක මුදල් නොගෙවීම පැහැර හැරීමක් සේ නොගෙවන එම ගණන් මත, එම වගන්ති හා කොන්දේසි යටතේ දායක මුදල් ගෙවීම යළි ඇරඹීමට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අවසරය ඇතිව අධ්‍යක්ෂවරුන් විසින් පහත දැක්වෙන කොන්දේසි වලට යටත් කොට ඉඩදීම නීත්‍යානුකූල විය යුත්තේ ය.

ගෙවීම පැහැර හැරි දායකයනට යළි ඉඩදිය හැකි බව

(අ) යම්කිසිවෙකු අතින් දායක මුදල් ගෙවීම පැහැර හැරුනේ අතපසු වීමකින් හෝ හදිසියේ බැරිවීමකින් හෝ බව එම තැනැත්තා විසින් අධ්‍යක්ෂවරුනට ඒත්තු ගැන්වුවහොත් හා සිද්ධියට අදාළ කරුණු සලකා බැලීමේදී ඒ පුද්ගලයා විසින් දායක මුදල් ගෙවීම යළි ඇරඹීමට යුක්ති සහගත කාලයක් තුළ දී ඉල්ලුම් කොට ඇති බව අධ්‍යක්ෂවරුනට පෙනී ගියහොත් මිස කිසිම කෙනෙකුට මෙම වගන්තියෙන් ප්‍රයෝජන ගැනීමට ඉඩ නොදිය යුත්තේ ය.

(ආ) දායක මුදල් ගෙවීම යළි අරඹන දිනට ඇති සියලුම හිඟ මුදල් නියමිත දිනට පසුව නම් වර්ෂයට සියයට හතරේද නැත්නම් සියයට හයේ ද වැල් පොලියකුත් සමඟ ගෙවා අවසන් නොකරන තාක් කිසිම කෙනෙකුට දායක මුදල් ගෙවීම යළි ඇරඹීමට ඉඩ නොදිය යුත්තේ ය. (1947.10.11)

(ඇ) දායක මුදල් ගෙවීම යළි ඇරඹීමට පෙර, රුපියල් පනහකට නොවැඩි, අධ්‍යක්ෂවරුන් විසින් සුදුසු සේ සලකනු ලබන මුදලක්, දඩයක් වශයෙන් අරමුදලේ බැරට ගෙවන ලෙස එබඳු පුද්ගලයෙකු වෙත නියෝග කළ හැක්කේ ය.

(2) දායක මුදල් ගෙවීම පැහැර හැරුණු පෙර අවස්ථාවලට මෙන්ම 1906 මාර්තු 14 වන දිනට පසු සිදු වූ පැහැරහැරීම් වලට ද මෙම වගන්තියේ විධිවිධානයන් එකසේ බලපෑ යුත්තේ ය.

18. භාර්යාවන් දෙදෙනකු හෝ වැඩි ගණනක් සිටින රාජ්‍ය නිලධාරියෙකු සම්බන්ධයෙන් මෙම ආඥාපනත ක්‍රියාවේ යෙදවීමේ දී:

බහු භාර්යාවන් සිටින කල ආඥාපනතේ බලපෑම

(1) මෙම ආඥාපනතේ කාර්යයන් සඳහා යම් නිලධාරියෙකුගේ පවත්නා විවාහ වලින් කාලය අනුව පළමුවැන්න වලංගු විවාහය ලෙස සැලකිය යුත්තේ ය. (1947.11.11)

එසේ වුවද යම් විවාහයක්, නිලධාරියෙකුගේ විවාහ වලින් කාලය අනුව පළමුවැන්නා බවට පත්වූයේ කලින් පැවති විවාහයක් අවලංගු කිරීමේ හේතුව පමණක් නිසාම නම් මෙම වගන්තියේ දෙවන ඡේදය යටතේ එකී දික්කසාදය වලංගු දික්කසාදයක් ලෙස සැලකුවහොත් මිස එකී විවාහය වලංගු විවාහයක් ලෙස නොසැලකිය යුත්තේ ය.

(2) නිලධාරියෙකුගේ යම් විවාහයක් අවලංගු කෙරෙන දික්කසාදය එම නිලධාරියාගේ වෙනත් යම් විවාහයක් අවලංගු කෙරෙන දික්කසාදයකට කවර කලෙකවත් පූර්වගාමී නොවූයේ නම් පමණක් මෙම ආඥාපනතේ කාර්යයන් සඳහා වලංගු දික්කසාදයක් ලෙස සැලකිය යුත්තේ ය.

(3) නිලධාරියෙකුගේ කිසියම් විවාහයක් මෙම ආඥාපනතේ කාර්යයන් සඳහා වලංගු විවාහයක් වන්නේ එම නිලධාරියාගේ වෙනත් යම් විවාහයක් අවලංගු කිරීමේ හේතුව නිසා වුවහොත් එකී අවලංගු වූ දිනට පසු දිනය ප්‍රථමයෙන් සඳහන් කළ විවාහය සිදු වූ දිනය ලෙස, එම විවාහයේ භාර්යාව වැන්දඹුවකු වූ කල ඇයට ද එම විවාහයෙන් උපන් යම් දරුවෙකු අනාථ දරුවෙකු වුවහොත් එම දරුවාට ද මෙම ආඥාපනත යටතේ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී සැලකිය යුත්තේ ය.

(4) (අ) නිලධාරියෙකුගේ ජීවිත කාලය තුළ කිසිම දවසක ඔහු සමඟ මෙම වගන්තියේ 1 වන ඡේදයේ දැක්වෙන අන්දමේ වලංගු විවාහයකට ඇතුළත් වීමට නොහැකි වූ කිසිම භාර්යාවකට හෝ

(ආ) නිලධාරියෙකුගේ කිසියම් දරුවෙකුගේ උපත සිදුවන අවස්ථාව වන විට ඉහත කී අන්දමේ වලංගු විවාහයක් සැළකිය නොහැකි කිසිම විවාහයකින් උපන් දරුවෙකුට හෝ මෙම ආඥාපනත යටතේ කිසියම් විශ්‍රාම වැටුපක් ප්‍රදානය නොකළ යුත්තේ ය.

බහු භාර්යාවන් ඇති රාජ්‍ය නිලධාරියෙකු කෙරෙහි 21 – 25 වගන්ති බලපාන අන්දම

(1947අ.11.11)

(1953අ.4.33)

19. අධ්‍යක්ෂවරුන් වෙත යැවිය යුතු ප්‍රකාශ හා දැන්වීම් ගැන කියැවෙන 21, 22, 23, 24 හා 25 (1) යන වගන්තිවල විධිවිධානයන් භාර්යාවන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් සිටින රාජ්‍ය නිලධාරියෙකු පිළිබඳ කාරණයේදී එම රාජ්‍ය නිලධාරියාගේ එක් එක් විවාහයට ද භාර්යාවන් හා එක් එක් දරුවාට ද එම විවාහයන් මෙම ආඥාපනතේ කාර්යයන් සඳහා වලංගු විවාහයන් සේ සැළකිය හැකි වුවත් නැතත්, සියලු ආකාරයෙන් බලපාන්නේ ය.

දික්කසාදයේ ප්‍රතික්‍රියා

(1947.11.11)

20. භාර්යාවන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් සිටින දායකයෙකු හැර අනෙක් දායකයෙකුගේ විවාහය දික්කසාදයකින් අවලංගු කරනු ලැබූ විටකදී මෙම

ආඥාපනතේ කාර්යයන් සඳහා එම දායකයා වැන්දඹු පුරුෂයෙකු ලෙස සැලකිය යුත්තේ ය.

පත්වීමේ දින සිට තුන්මසක් ඇතුළත විස්තර සැපයිය යුතු බව

(1947.12.11)

21. සෑම රාජ්‍ය නිලධාරියෙකු විසින්ම, ඔහු අරමුදලේ දායකත්වය ලැබීමට සුදුසුසකු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත ඔහු එසේ දායකත්වය ලැබීමට සුදුස්සෙකු වූ දිනය, ඔහුගේ සම්පූර්ණ නම, හා උපන්දිනය, විවාහක නම් විවාහ වූ දිනය, භාර්යාවගේ කන්‍යා නාමය හා උපන් දිනයද දරුවන් සිටී නම් ඔවුන්ගේ නම් හා උපන්දිනයන්ද දැක්වෙන ප්‍රකාශනයක් අධ්‍යක්ෂවරුන් වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

විවාහය දැන්විය යුතු බව

22. මෙම ආඥාපනත සම්මත වීමෙන් අනතුරුව විවාහ වන සෑම රාජ්‍ය සේවකයෙකු විසින්ම විවාහයෙන් තුන්මසක් ඇතුළත විවාහයේ දිනය ද භාර්යාවගේ කන්‍යා නාමය හා උපන් දිනය ද විවාහ වීමට පෙර ඔහු නිසා ඇයට උපන් දරුවන් ඇත්නම් ඔවුන්ගේ නම් හා උපන් දිනයන් ද දැක්වෙන ප්‍රකාශනයන් අධ්‍යක්ෂවරුන් වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

ළමයකුගේ උපත හෝ ළමයකු දරුකමට හදා ගැනීම නිලධරයා විසින් දැන්විය යුතු බව.

[1]23. සෑම රජයේ නිලධරයකු විසින් ම, මේ ආඥා පනත සම්මත වීමෙන් පසු ඔහුට දාව උපන් හෝ ඔහු විසින් නීත්‍යානුකූලව දරුකමට හදාගන්නා ලද සෑම ළමයෙකුගේම උපන් දිනය, අවස්ථාවෝචිත පරිදි, ඒ උපතේ හෝ දරුකමට හදාගැනීමේ දින සිට මාස තුනක් ඇතුළත අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු ය.

දරුවන්ගේ උපත්, විවාහ හා මරණ ද බිරියගේ දික්කසාදය හා මරණය ද දන්වා සිටිය යුතු බව.

24. තම භාර්යාව මිය ගිය හෝ තමාගෙන් දික්කසාද වූ හෝ දරුවකු මියගිය හෝ ගැහැණු දරුවකු විවාහ වූ හෝ සෑම රාජ්‍ය නිලධාරියෙකු ද මිය යන දරුවන්ගේ සහ විවාහ වන ගැහැණු දරුවන්ගේ භාරකාරයෙකු ද විසින් එම මරණය, විවාහය හෝ උපත සිදු වූ දිනෙන් මාස තුනක් ඇතුළත ඒවා පිළිබඳ දිනයන් අධ්‍යක්ෂවරුන් වෙත දැන්විය යුත්තේ ය.

පරිපූරක විස්තර හා සාක්ෂි ඉදිරිපත් කිරීම.

25. (1) 21 සහ 22 වගන්ති ප්‍රකාර එවා ඇති ප්‍රකාශයන්හි හෝ 23 හා 24 වගන්ති ප්‍රකාර කර ඇති දැන්වීම්වල හෝ ඇති විස්තර සාවද්‍ය හෝ අඩුපාඩු බව පෙනී ගියහොත් නිවැරදි තොරතුරු සහිත හෝ අඩුපාඩු සම්පූර්ණ කළ වෙනත් ප්‍රකාශයක් හෝ දැන්වීමක් නියම කරනු ලබන දිනයකට පෙර තමන් වෙත ලැබෙන්නට සලස්වන ලෙස අධ්‍යක්ෂවරුන් විසින් එම තොරතුරු සැපයූ රාජ්‍ය නිලධාරියා වෙත හෝ භාරකාරයා වෙත ලිඛිතව දැනුම් දිය යුත්තේ ය.

එසේ අනෙක් ප්‍රකාශයක් හෝ දැන්වීමක් සපයන ලෙස ඉල්ලනු ලැබූ විට නියමිත කාලය තුළ ඒවා සැපයීම සෑම රාජ්‍ය නිලධාරියෙකුගේ ද භාරකරුවෙකුගේ ද වගකීම වන්නේ ය.

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

(1953හි.05.23)

(1947හි.13.11)

(2) 21 හෝ 22 වගන්ති හා මේ වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරුන් වෙත කරන ප්‍රකාශ හෝ 23 හෝ 24 වන වගන්ති සහ මෙම වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ කරන දැන්වීම් හෝ ඉදිරිපත් කරන රාජ්‍ය නිලධාරීන්ගෙන් සහ 24 වන වගන්තිය සහ මේ වගන්තියේ 1 වන උපවගන්තියේ ප්‍රකාර දැන්වීම් කරන භාරකාරයන්ගෙන් හෝ එම ප්‍රකාශයන්හි දැන්වීම්වල අන්තර්ගත කරනු ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබුවහොත් ඔවුන් විසින් එසේ කළ යුත්තේ ය.

මෙම නීතිය කැඩීම ගැන දඬුවම් කළ හැකි බව.

26. තමන් වෙත පැවරී ඇති කිසියම් වගකීමක් හෝ මෙම ආඥාපනත හා එහි යටතේ පනවා මෙහි මතු දැක්වෙන නීති හෝ රෙගුලාසි හෝ අනුව නියම වී ඇති ක්‍රියාවක් ඉටු කිරීමට, අධ්‍යක්ෂවරුන්ගේ විනිශ්චය අනුව, අසමත් වූ මගහැරියා වූ හෝ ප්‍රතික්ෂේප කළා වූ සෑම රාජ්‍ය නිලධාරියෙකුම ද අසත්‍ය තොරතුරු සැපයූ හෝ අසත්‍ය ප්‍රකාශ කළ හෝ සෑම රාජ්‍ය නිලධාරියකුම ද විසින් සෑම මගහැරීමකට, පැහැරහැරීමකට, ප්‍රතික්ෂේප කිරීමකට, අසත්‍ය තොරතුරු හෝ අසත්‍ය ප්‍රකාශ සැපයීමකට රුපියල් පනහකට නොවැඩි දඩයක් ගෙවිය යුතු යයි අධ්‍යක්ෂවරුන් විසින් නියම කළ හැක්කේ ය. අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන්ගේ නිගමනය භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත දැනුම් දුන් පසු ඔහු විසින්, වැටුප් වශයෙන් හෝ වෙනත් විධියකින් හෝ එම රාජ්‍ය නිලධාරියාට ගෙවීමට ඇති ප්‍රථම මුදලෙන්, එම දඩය අඩුකොට ගෙන එම දඩ මුදල අරමුදලේ බැරට ගෙවිය යුත්තේ ය.

විශ්‍රාම වැටුප හිමි කාටද යන්න ගැන.

27. මෙහි මතු දැක්වෙන නිදහස් කළවුන් හැර මේ ආඥාපනතේ හෝ 1885 හි අංක 20 සහ 1896 හි අංක 21 දරණ ආඥාපනත්වල විධිවිධානයන් අනුව අරමුදලට දායක මුදල් ගෙවූ රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවෝ සහ අනාථ දරුවෝ අරමුදලෙන් විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ලබන්නෝ වෙති. යම් රාජ්‍ය නිලධාරියෙකුගෙන් අරමුදලට අයවිය යුතු ණයක් ඇත්නම් එය සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු කිසිම රාජ්‍ය නිලධාරියෙකුගේ වැන්දඹුවකට හෝ අනාථ දරුවෙකුට හෝ විශ්‍රාම වැටුපක් හිමි විය යුත්තේ හෝ ගෙවිය යුත්තේ හෝ නොවේ.

[1]27අ (1) අරමුදලට දායක වී ඇති යම් රාජ්‍ය නිලධරයකු, තත්කාලයේ බලපවත්නා යම් හදිසි නීති නියෝගයක් යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් හේතුවෙන් හෝ යම් ස්වාභාවික ආපදාවක් හේතුවෙන් ඔහු විශ්‍රාම ගැනීමේ වයසට එළඹීමට පෙරාතුව මිය යන අවස්ථාවක දී, මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද ඒ නිලධරයාගේ වැන්දඹුව හා අනත් දරුවන්--

හදිසි නීති නියෝග ආදිය යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් හේතුවෙන් මිය යන රාජ්‍ය නිලධරයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම.

[1]2010 අගෝස්තු මස 20 වැනි දින 2010 අංක 08 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](අ) ඔහු මිය ගිය අවස්ථාවේ දී ලබමින් සිටි වැටුප මත පදනම්ව මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඔහු මිය ගිය දින සිට, ඔහු ජීවත්ව සිටියේ නම් ඔහු ඔහුගේ විශ්‍රාම ගැනීමේ වයසට එළඹෙන දින තෙක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය; සහ

(ආ) ඔහු ජීවත්ව සිටියේ නම් ඔහු විශ්‍රාම ගත යුතු වයස තෙක් ලැබීමට හිමිකම තිබූ සියලු වැටුප් වැඩිවීම් සහිත වූ සංශෝධිත වැටුප මත පදනම්ව, මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඔහු විශ්‍රාම ගැනීමේ වයසට එළඹිය යුතු දින සිට සහ ඉන්පසුව ලැබීමට හිමිකම ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී, විශ්‍රාම ගැනීමේ වයස යන්න අදාළ නිලධරයාගේ මරණය පිළිබඳ අවස්ථානුගත තත්ත්වයන් ද, ඔහුගේ සේවා කාලය ද, එක් එක් විශේෂ සිද්ධියට බලපාන වැදගත් වෙනත් විස්තර ද සැලකිල්ලට ගනිමින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කළ යුතු ය.

(3) රාජ්‍ය සේවයේ තාවකාලික හෝ අනියම් තනතුරක් දරන, පුරුෂයකු වන්නා වූ යම් තැනැත්තකු, සේවා කාලය තුළ දී හදිසි නීති නියෝග යටතේ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් හේතුවෙන් හෝ යම් ස්වාභාවික ආපදාවක් හේතුවෙන් ඔහුගේ ධුරයේ ස්ථිර වීමට පෙරාතුව මිය යන අවස්ථාවක දී, ඒ තැනැත්තා, මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඔහු මිය ගිය දින සිට මේ ආඥාපනතේ 27 වන වගන්තියේ විධිවිධාන අදාළ වනු ලබන නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු අතර මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද ඒ තැනැත්තාගේ වැන්දඹුව සහ අනත් දරුවන්--

(අ) එකී මිය ගිය දින සිට, ඔහු ජීවත්ව සිටියේ නම් ඔහුට වයස අවුරුදු පනස් පහ එළඹෙන දින තෙක් කාලය තුළ, මිය යන විට ඔහු විසින් උපයමින් තිබූ ගෙවීම් මත පදනම්ව මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කළ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය;

(ආ) ඔහු ජීවත්ව සිටියේ නම් වයස අවුරුදු පනස්පහ වනතෙක් ලැබීමට හිමිකම් තිබූ සියලු වැටුප් වැඩි වීම් සහිත විශ්‍රාම වැටුපක් ඔහුට වයස අවුරුදු පනස් පහ එළඹිය යුතු දින සිට සහ ඉන්පසු ලැබීමට හිමිකම ලැබිය යුතු ය.

---

[1]2010 අගෝස්තු මස 20 වැනි දින 2010 අංක 08 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](4) (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තකු ඔහු රාජ්‍ය සේවයට බැඳුනු දින සිට ආඥාපනත යටතේ දායකයකු වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා, මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද නිලධරයන් සහ (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තන් ඔවුන් මිය ගිය දින වන විට අරමුදලට අයවිය යුතු දායක මුදල් සම්පූර්ණ වශයෙන් ගෙවා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා--

"හදිසි නීති නියෝග" යන්නෙන්, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග කිසිවක් අදහස් වේ.

"ස්වාභාවික ආපදා" යන්නට 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ ඒ සඳහා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ නිලධරයකුගේ වැන්දඹුවක සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම.

[1]27ආ. 27 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද--

(අ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති; සහ

(ආ) වසර පහක සේවා කාලය සම්පූර්ණ කිරීම මත විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන නිලධරයකුගේ වැන්දඹුවක, ඒ නිලධරයාගේ අභාවයෙන් පසු, මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව විශ්‍රාම යන අවස්ථාවේ ඒ නිලධරයා විසින් උපයන ලද වැටුප මත පදනම්ව ගණනය කරන ලද විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය. දායක මුදල් ප්‍රමාණය එකී නිලධරයා විසින් උපයන ලද වැටුප මත පදනම්ව ගණනය කළ යුතු අතර, අවුරුදු පහක සම්පූර්ණ කාලයක් සඳහා ඒ දායක මුදල් පොළිය සමඟ අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර, ඒ මත උපචිත දායක මුදල් පොළිය ද සමඟ ගෙවා ඇත්නම්

මිස සහ එසේ ගෙවන තෙක්, මේ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ නොකළ යුතු ය.

[1]2010 අගෝස්තු මස 20 වැනි දින 2010 අංක 08 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

28. විවාහයෙන් අවුරුද්දක් ඇතුළත මියයන රාජ්‍ය නිලධාරියෙකුගේ වැන්දඹුවට, එම විවාහය නිසා උපන් නීත්‍යානුකූල දරුවෙක් නොමැත්තේ නම් මේ ආඥාපනත යටතේ කිසිදු විශ්‍රාම වැටුපකට හිමිකම් නොමැත්තේ ය. අරමුදලට දායක මුදල් ගෙවන රාජ්‍ය නිලධාරියෙකුට දාව විවාහයට පෙර උපන් දරුවෙකු ඇති මවක සමඟ එම රාජ්‍ය නිලධාරියා පසුව විවාහ වීම නිසා නීත්‍යානුකූල ධාරකභාවය ලබන දරුවෙකුට එම නිලධාරියා විවාහයෙන් දොළොස් මසක් ඇතුළත මිය ගියේ නැත්නම් අරමුදලෙන් විශ්‍රාම වැටුපක් හෝ දීමනාවක් හෝ ලැබීමට හිමිකම් ලැබෙන අතර එම නිලධාරියා දොළොස් මසක් ඇතුළත මිය ගියේ නම් එම දරුවාට අරමුදලේ කිසිදු අයිතියක් හිමි නොවන්නේ ය.

අරමුදලේ ප්‍රයෝජන ලැබිය නොහැකි අය.

එතෙකුදු වුවත් එබඳු වැන්දඹුවකුට හෝ දරුවකුට විශ්‍රාම වැටුපක් හෝ දීමනාවක් ලබාදීම සාධාරණයයි ද යුක්ති සහගතයි ද හැගෙන්නේ නම් භාණ්ඩාගාර ලේකම්ගේ කැමැත්ත ඇතිව අධ්‍යක්ෂවරුන් විසින් එසේ ගෙවීම නීත්‍යානුකූල වන්නේය.

(1947හි 14.11)

29. අනාථ දරුවනට දීමනා හෝ විශ්‍රාම වැටුප් ගෙවීම, පිරිමි දරුවනට වයස අවුරුදු දහ අටේදී ද ගැහැණු දරුවනට විවාහයේදී හෝ වයස අවුරුදු 21 දී ද නතර විය යුත්තේ ය.

අනාථ දරුවනගේ විශ්‍රාම වැටුප් නතර කළ යුතු අවස්ථා.

එතෙකුදු වුවත්, අනාථ පිරිමි දරුවෙකුගේ පියා 1906 මාර්තු 14 වන දිනට පෙර රාජ්‍ය සේවයට පත්වූ නිලධාරියෙකු වන්නේ නම් ද එම පිරිමි දරුවා නියමිත දින හෝ ඉන්පසුව වයස අවුරුදු දහ අට සපුරන්නේ නම් ද ඔහුට වයස අවුරුදු 21 දී නතර කළ යුත්තේ ය.

(1947හි 15.11)

[1]එසේම තවදුරටත් වයසින් අවුරුදු විසි එකක් වූ හෝ ඊට වැඩි වූ පිරිමි අනත්දරුවකු හෝ [2]ගැහැණු අනත්දරුවකු හෝ රැකියා විරහිතව සිටින තාක්කල්, ඔහු හෝ ඇය වයසින් අවුරුදු විසිහය වන තුරු දීමනාව හෝ විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

[3]29අ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පත් කරන ලද වෛද්‍ය නිලධරයන් තුන් දෙනකුගෙන් සමන්විත වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් විසින් අනත් දරුවකු ඔහුගේ

නිත්‍ය අබලතාවට පත් අනත් දරුවනට යාව ජීව විශ්‍රාම වැටුප්.

ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි වන්නා වූ ශාරීරික හෝ මානසික අශක්‍යතාවකින් පෙළෙන බවට තීරණය කළ විටක ඒ අනත් දරුවාට, වයස ගැන නොතකා, මේ ආඥාපනත යටතේ යාව ජීව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම තිබිය යුතු ය.

---

[1]1998 දෙසැම්බර් මස 31 වැනි දින 1998 අංක 64 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන)පනත.

[2]2010 අගෝස්තු මස 20 වැනි දින 2010 අංක 08 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[3]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

විශ්‍රාම වැටුප ආගණනය කරන ආකාරය.

[1]30. මියගිය රජයේ නිලධරයකුගේ වැන්දඹුවට හෝ දරුවකුට හිමි විශ්‍රාම වැටුප හෝ දීමනාව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද චක්‍ර අනුව 57 අ වගන්තියේ විධිවිධානවලට යටත්ව ආගණනය කළ යුතු ය. අමාත්‍යවරයා විසින් කලින් කල පත් කරනු ලබන ජීවන ගණකවරයකු හෝ ජීවන ගණකවරයන් විසින් ඒ චක්‍ර ගැලපීම සහ ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය. සන්තකයෙන් හෝ අපේක්ෂාවෙන් සහ ප්‍රතිවර්තනයෙන් යන කවරාකාරයකින් වුව ද මේ වගන්තිය යටතේ වැන්දඹුවන්ට හෝ දරුවන්ට ගෙවිය යුතු සියලු විශ්‍රාම වැටුප් නැවත ගැලපීමට යටත් විය යුතු ය. ඒ විශ්‍රාම වැටුප් එසේ ගලපන ලද සහ ප්‍රතිශෝධනය කරන ලද චක්‍ර අනුව ආගණනය කළ යුතු අතර ඒ අනුව අඩු හෝ වැඩි කළ යුතු ය.

අරමුදලේ වත්කම් තක්සේරු කළ යුතු ය.

31. මෙම ආඥාපනතේ 30 වන වගන්තියෙන් බලාපොරොත්තු වන, අරමුදලේ වටිනාකම තක්සේරු කිරීම 1933 දෙසැම්බර් මස 31 වන දින දක්වා ත්‍රෛවාර්ෂිකව ද තදනන්තරව අමාත්‍යතුමා විසින් නියම කෙරෙන දිනයන් හි දී ද කළ යුත්තේ ය.

අරමුදලේ වත්කම් සහ බැරකම් වාරානුකූලව ජීවනගණකීය තක්සේරු කිරීම් වලින් ලැබෙන අතිරික්ත යෙදවීම.

[1]32. 1909 මාර්තු 31 දිනයෙහි අරමුදලේ වත්කම් සහ බැරකම් තක්සේරුව ඇතුළුව, මේ ආඥාපනතේ 31 වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි අරමුදලේ වත්කම් සහ බැරකම් වාරානුකූලව ජීවන ගණකීය තක්සේරු කිරීම්වලින් අනාවරණය වන්නා වූ අතිරික්තවලින් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි ප්‍රතිශත, ඒ එක් එක් තක්සේරු දිනට අරමුදලේ දායකයින්ගේ සහ අවුරුදු හැටපහ වයසට එළඹී හෝ සේවය අවසන් කරන ලද පූර්ව දායකයින්ගේ සහ ඒ එක් එක් තක්සේරු දිනට විශ්‍රාමිකයන් විය හැකි සියලු දෙනාගේම ද වැන්දඹුවන්ගේ සහ අනත්දරුවන්ගේ අනාගත විශ්‍රාම වැටුප් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව විෂයය භාර අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි කොටස්වලින් සහ අනුපාතයන්ගෙන් සහ ආකාරයකින් වැඩි කිරීම සඳහා යෙදවිය යුතු ය.

33. (1) විශ්‍රාම වැටුපට හිමිකම් ඇති දරුවකු හෝ දරුවන් හෝ සිටියදී අවිවාහක වැන්දඹු පුරුෂයකු ලෙස රාජ්‍ය සේවකයෙකු මිය යතොත් හෝ මියගොස් ඇතොත් ද විශ්‍රාම වැටුපට හිමිකම් ඇති දරුවකු හෝ දරුවන්ගේ ජීවත්ව සිටිය දී යම් රාජ්‍ය නිලධාරියෙකුගේ වැන්දඹුව මියගොස් ඇතොත් හෝ මිය යතොත් ද එකී දරුවාගේ හෝ දරුවන්ගේ හෝ විශ්‍රාම වැටුප විය යුත්තේ එම වැන්දඹුවට ලැබෙන්නට තිබුණු හෝ ලැබෙමින් තිබුණ හෝ විශ්‍රාම වැටුප එම දරුවන් අතර සමව බෙදුණු කළ ලැබිය හැකි ප්‍රමාණයයි.

ළමයින්ට හා දරුකමට හදාගත් ළමයින්ට විශ්‍රාම වැටුප්

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](2) විවාහක රජයේ නිලධරයකු දායකයකු වශයෙන් සිටිය දී ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ ළමයින් දරුකමට හදා ගැනීමට අදාළ වෙනත් යම් නීතියක විධිවිධාන යටතේ හෝ දරුකමට හදාගන්නා ළමයකු (3) වන උපවගන්තියේ සහ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, දරුකමට හදා ගන්නා තැනැත්තාගේ දරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය. ඒ අනුව ඒ රජයේ නිලධරයාගේ ළමයකු මේ ආඥාපනත යටතේ යම් ආකාරයක හා ප්‍රමාණයක විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේ ද ඒ ආකාරයටම සහ ප්‍රමාණයටම දරුකමට හදා ගන්නා ලද ළමයා ද විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) ළමයා දරුකමට හදා ගැනීමට නිර්ව්‍යාජ අධ්‍යාශයක් නොමැති බව සහ හුදෙක්ම පහසුකම් තකා දරුකමට හදා ගැනීමක් බව විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට හේතු ඇත්නම් මිස, විවාහක රජයේ නිලධරයකු දායකයකු වශයෙන් සිටිය දී ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ ළමයින් දරුකමට හදා ගැනීමට අදාළ වෙනත් යම් නීතියක විධිවිධාන යටතේ හෝ දරුකමට හදා ගන්නා ළමයකු මේ ආඥාපනත යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ ළමයාට නිදහස් ජීවනෝපායක් නොමැති විටක සහ ඒ ළමයාට විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීම ඒ කාරණයට අදාළ සියලුම කරුණු අනුව සාධාරණ සහ යුක්ති සහගත යයි අධ්‍යක්ෂවරයා සලකනු ලබන්නේ නම් අධ්‍යක්ෂවරයා විසින් ඒ ළමයාට විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීමට බලය දෙනු ලැබිය හැකි ය."

[2]34. (1) දායකයකුගේ වැන්දඹුවක, ඇය නැවත විවාහ වීමේ දී, ඒ දෙවන විවාහය වූ දිනට පසුව සිට විශ්‍රාම වැටුප ලෙස--

වැන්දඹුවක නැවත විවාහ වීම සම්බන්ධයෙන් වූ විධිවිධාන.

(අ) ඒ දෙවන විවාහය සිදුවන අවස්ථාවේ දී ඇය ලබමින් සිටි විශ්‍රාම වැටුපෙන් අර්ධයක්; හෝ

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[2]2010 අගෝස්තු මස 20 වැනි දින 2010 අංක 08 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](ආ) විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම තිබුණ ද, සැබෑ වශයෙන් එය එතෙක් නොලැබ තිබූ විටෙක, ඒ දෙවන විවාහයට පෙරාතුව, වැන්දඹුවක ලෙස ඇගේ තත්ත්වයෙන් ඇයට ලැබීමට තිබූ මුදල් ප්‍රමාණයෙන් අර්ධයක්,

ලැබීමට හිමිකම ලැබිය යුතු ය.

(2) ඉහත (අ) හෝ (ආ) ඡේදවල නියමයන්ට අනුව වැන්දඹුවට ගෙවනු ලැබීමෙන් පසු, වැන්දඹුව ලබමින් සිටි විශ්‍රාම වැටුපේ ඉතිරි කොටස වැන්දඹුවගේ ප්‍රථම විවාහයේ දරුවන් වෙත ලැබිය යුතු ය.

(3) ඒ දෙවන විවාහයේ කලත්‍රයාත් අරමුදලේ දායකයකු වන අවස්ථාවේ දී සහ ඒ කලත්‍රයාගේ මරණින් පසු ඒ කලත්‍රයා විසින් අරමුදලට ගෙවන ලද දායක මුදල් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුපක් ලැබීමට ද ඒ වැන්දඹුව හිමිකම් ලබන අවස්ථාවක දී (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල නියමයන්ට අනුව විශ්‍රාම වැටුපක් ලෙස ඇය විසින් ලැබූ යම් මුදලක් ගෙවීම දෙවන විවාහයේ ඇගේ කලත්‍රයා මියගිය දින සිට බලපැවැත්වෙන පරිදි අවසන් කළ යුතු ය:

එසේ වුව ද, ඉහත විධිවිධාන සලසා ඇති පරිදි විශ්‍රාම වැටුපක් ගෙවීම අවසන් කරන ලද අවස්ථාවක දී, වැන්දඹුවගේ පළමු විවාහයේ දරුවන් හට, ඔවුන්ගේ මවගේ දෙවන විවාහයේ කලත්‍රයා මියගිය දින සිට, (2) වන උපවගන්තියට අනුව ඔවුන් ලබමින් සිටි කොටස් සහ එකී අවසන් කිරීමට පෙරාතුව (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව තම මව ලබමින් සිටි යම් මුදලක් ද ලබාගැනීමට හිමිකම් තිබිය යුතුය.

එසේ වුව ද, වැඩි දුරටත්, ඒ දෙවන විවාහය විසුරුවා හරින අවස්ථාවක දී, වැන්දඹුවට, (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඇය ලැබූ අර්ධය විශ්‍රාම

වැටුපක් ලෙස ලැබීමට හිමිකම් ලැබිය යුතු අතර, (2) වන උපවගන්තිය යටතේ දරුවන්ට ඇති හිමිකමේ වෙනසක් නොවන්නේ ය.

විශ්‍රාම වැටුප් ගෙවිය යුතු මෙහි මීට පෙර දී පෙන්වා දී ඇති ආකාරයට විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ලැබිය යුත්තේ ය.

පෙර විවාහයක දරුවන් හා වැන්දඹුව සඳහා විධි විධාන

35. අරමුදලේ දායකකම ලබන අවස්ථාව වන විට පැවති කලින් විවාහයක හෝ දායකකම ලැබීමෙන් අනතුරුව ගිවිසගත් විවාහයක හෝ ප්‍රශ්නය වැන්දඹුවට හා දරුවනට ඉතිරි කොට තබා යම් රාජ්‍ය නිලධාරියෙකු මිය ගියහොත් ද එම දරුවන් අරමුදලෙන් විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් කියහැකි වයසේ දරුවන් වුවහොත් ද එබඳු එක් එක් දරුවෙක්, පියාගේ ඇවෑමෙන් බව ජීවත්ව සිටිනම් ඇයට උරුම වන විශ්‍රාම වැටුපෙන් අර්ධයක් සමව බෙදා ලැබෙන කොටසට හෝ පංගුවට හිමිකරුවෝ විය යුත්තෝ ය. එබඳු රාජ්‍ය නිලධාරියෙකුගේ වැන්දඹුව, එබඳු දරුවන් නොමැති නම් ඇයට ලැබිය හැකිව තිබුණු විශ්‍රාම වැටුපෙන් අර්ධයකට හිමිකාරිය විය යුත්තේ ය. එම රාජ්‍ය නිලධාරියා එබඳු දරුවන් නොමැතිව මිය ගියේ නම් හෝ එම වැන්දඹුව, දරුවන් නැති වැන්දඹුවක සේ පූර්ණ විශ්‍රාම වැටුප් ලැබිය යුත්තේ ය.

---

[1]2010 අගෝස්තු මස 20 වැනි දින 2010 අංක 08 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

රාජ්‍ය නිලධාරියා සමඟ සිය විවාහය පිළිබඳ ගැටළුවක් ඉතිරි කොට නොතබා ඒ වැන්දඹුව මිය ගියා නම් එම රාජ්‍ය නිලධාරියා දෙවෙනි විවාහයකට ඇතුළත් නොවූවකු සේ සලකා ඔහුගේ පළමු විවාහයේ දරුවනට විශ්‍රාම වැටුප ගෙවිය යුත්තේ ය. සිය විවාහය පිළිබඳ ගැටළුවක් ඉතිරි කොට තබා එම වැන්දඹුව මිය ගියා නම් ඇයට හිමිවන විශ්‍රාම වැටුපෙන් සම කොටස හෝ පංගුව හෝ බැගින් පළමු විවාහයේ දරුවනට ලැබිය යුත්තේ ය.

වැන්දඹු පුරුෂයකුගේ දරුවන්ට විශ්‍රාම වැටුප්.

36. අරමුදලේ දායකයකු වීමට සිටින හෝ දායකයෙකු වී සිටින හෝ වැන්දඹු පුරුෂයෙකුගේ දරුවනට ඔහුගේ මරණින් පසුව ද, මෙම ආඥාපනත ක්‍රියාත්මක වීමට පෙර මියගිය දායක වැන්දඹු පුරුෂයෙකුගේ මෙම ආඥාපනත ක්‍රියාත්මක වීමෙන් පසුව ද ඔහු දායකයකු වන අවස්ථාව වන විට මව ජීවත්ව සිටියේ නම් දරුවන්ට හිමිවිය හැකිව තිබුණු විශ්‍රාම වැටුප හිමිවිය යුත්තේ ය.

මාසිකව විශ්‍රාම වැටුප් ගෙවිය යුතු බව.

37. (1) මෙම ආඥාපනත යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ලබන කිසියම් පුද්ගලයෙකුටගෙවිය යුතු විශ්‍රාම වැටුප, ප්‍රස්ථාවානුකූලව, රාජ්‍ය නිලධාරියාගේ හෝ ඔහුගේ වැන්දඹුවගේ මරණින් පටන්ගෙන දෛනිකව එකතු කොට මාසිකව ගෙවිය

යුත්තේ ය. එහෙත් එසේ ගෙවීමට පෙර විශ්‍රාම වැටුපට අයිතිය කියන එබඳු වැන්දඹුවකු හෝ දරුවකු සිටින්නේ දැයි හා ඔවුනට එබඳු අයිතියක් තිබේදැයි තහවුරු කරන ලෙස අධ්‍යක්ෂවරුන් විසින් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන්නේ ය.

[1](2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, 1976 අගෝස්තු 1 වන දින සිට සහ ඊට පසු මේ ආඥාපනත යටතේ වැන්දඹුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප, ඒ වැන්දඹුව මිය යනුයේ යම් මාසයක ද ඒ මාසයේ අවසානය තෙක් ගෙවනු ලැබිය යුතු ය.

38. වැන්දඹුවකට මෙම ආඥාපනත යටතේ ගෙවීමට ඇති විශ්‍රාම වැටුප ඇය වෙනුවෙන් සුදුසු හා නිසි පුද්ගලයෙකුට අධ්‍යක්ෂවරුන් විසින් ගෙවිය හැක්කේ ය. එසේ ගෙවූ කළ එය භාරගන්නා පුද්ගලයා, අධ්‍යක්ෂවරුන්ගේ නියමයන් හා කොන්දේසි අනුව වැන්දඹුවගේ ද ඇගේ මරණින් පසු ඇගේ විශ්‍රාම වැටුපට හිමිකම් ලබන දරුවන්ගේ ද නඩත්තුව ආධාර උපකාරය හෝ ශුභ සිද්ධිය පිණිස එම මුදල ගෙවිය යුත්තේ ය.

වැන්දඹුවකට හිමි විශ්‍රාම වැටුප

(1947.20.11)

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

39. මෙම ආඥාපනත යටතේ විශ්‍රාම වැටුප් ලබන වැන්දඹුවක විසින් ඇගේ මරණින් පසු විශ්‍රාම වැටුප් අයිතිවන දරුවෙකු තනි කොට දමා හෝ අතහැර දමා හෝ ගොස් ඇතැයි ද ඇය තමාගේ වත්කම් අනුව එම දරුවා නඩත්තු කරන්නේ හෝ ආධාර උපකාර කරන්නේ හෝ නැතැයි ද අධ්‍යක්ෂවරුනට පෙනී ගියහොත් අධ්‍යක්ෂවරුන්ගේ අභිමතය පරිදි එම දරුවා හෝ දරුවන් වෙනුවෙන් වෙනත් අයෙකුට වැන්දඹුවගේ විශ්‍රාම වැටුපෙන් සුදුසුයයි හැඟෙන යම් කොටසක් ගෙවීමට අධ්‍යක්ෂවරුනට හැක්කේ ය. එසේ ගෙවන ලද කොටස වෙනුවෙන් කිසිම ඉල්ලීමක් කිරීමට වැන්දඹුවට, නොහැක්කේ ය.

දරුවා නඩත්තු කිරීමට අපොහොසත්

මෙම වගන්තිය යටතේ වැන්දඹුවකගේ විශ්‍රාම වැටුපෙන් දරුවකු වෙනුවෙන් ගෙවන ලද කොටස භාරගන්නා තැනැත්තා එම මුදල අධ්‍යක්ෂවරුන් නියම කරන වගන්ති හා කොන්දේසි අනුව එම දරුවාගේ යැපීම, නඩත්තුව හා ශුභසිද්ධිය පිණිස යෙදවිය යුත්තේ ය.

40. මෙම ආඥාපනත යටතේ බාල වයස්කාරයකුට හිමි විශ්‍රාම වැටුප අධ්‍යක්ෂවරුන් විසින් එම බාලවයස්කාරයාට හෝ නොඑසේ නම් බාල වයස්කාරයා වෙනුවෙන්,

බාලවයස්කාරයෙකුට විශ්‍රාම වැටුප්

(1947.21.11)

බලලත් නිලයක් දරණ අයෙකුට හෝ අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ අත්සනින් ලිඛිතව පත්කරනු ලබන අයෙකුට හෝ ගෙවිය හැක්කේ ය. එසේ පත්කරනු ලැබූ පුද්ගලයෙකුට එම විශ්‍රාම වැටුප ගෙවුවහොත් එම පුද්ගලයා අධ්‍යක්ෂවරුන් විසින් නියම කරනු ලබන වගන්ති හා කොන්දේසි අනුව එම බාලවයස්කාරයාගේ යැපීම, රැකවරණය, හා ශුභසිද්ධිය පිණිස එම මුදල යෙදවිය යුත්තේ ය.

41. අරමුදලෙන් ගෙවනු ලබන කිසිම විශ්‍රාම වැටුපක් අන්සතු කළ නොහැක්කේ ය. මාරු කළ නොහැක්කේ ය. යම් විධියකින් එසේ කරනු ලැබුවහොත් ඒ සෑම අන්සතු කිරීමක් ද මාරු කිරීමක් ද පරම නිශ්ප්‍රභ විය යුත්තේ ය. පරමශුන්‍ය විය යුත්තේ ය. පරම අකර්මන්‍ය විය යුත්තේ ය. කිසිම විශ්‍රාම වැටුපක් එම විශ්‍රාම වැටුප ලබන්නාගෙන් අයවිය යුතුව ඇති මුදලකට, ණයකට හිලව් කිරීම හෝ අඩුකර ගැනීම හෝ අත්අඩංගුවේ තබා ගැනීම හෝ නොකළ යුත්තේ ය.

විශ්‍රාම වැටුප් අන්සතු කළ නොහැකි බව.

42. මෙම ආඥාපනතෙන් අදහස් කෙරෙන රාජ්‍ය නිලධාරියා කවරෙක් ද? රාජ්‍ය නිලධාරියෙකුගේ වැන්දඹුව හෝ දරුවන් හැටියට විශ්‍රාම වැටුප හිමිවිය යුත්තේ කාට ද ; ඔවුනට හිමි විය යුතු විශ්‍රාම වැටුප කොපමණ ද ; ආදී වශයෙන් පැන නගින කරුණක් ගැන හෝ මෙම ආඥාපනතේ වගන්තියක තේරුම ගැන හා පද පිළිවෙල ගැන හෝ ආඥාපනත යටතේ සාදන ලද කිසියම් නීතියක් හෝ රෙගුලාසියක් ගැන හෝ අධ්‍යක්ෂවරුන්, නිලධාරීන්, වැන්දඹුවන් හෝ අනාථ දරුවන් විසින් කිසියම් ගැටළුවක් මතු කරනු ලැබුවහොත් එම ගැටළුව නිරාකරණය කරනු පිණිස අධ්‍යක්ෂවරුන් විසින් භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කළ යුත්තේ ය. එහිදී භාණ්ඩාගාර ලේකම් විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය විය යුත්තේ ය.

ප්‍රශ්න, ගැටළු හා මතභේද භාණ්ඩාගාර ලේකම් විසින් විසඳිය යුතු බව.

(1947.22.11)

43. (1) රාජ්‍ය නිලධාරියෙකු අරමුදලේ දායකකමින් ඉවත් වූ පසු ඔහු විසින් ගිවිස ගන්නා ලද විවාහක වැන්දඹුවට හෝ එම විවාහයේ දරුවනට හෝ විශ්‍රාම වැටුප් හිමි නොවිය යුත්තේ ය.

විශ්‍රාම වැටුප් හිමි නොවන වැන්දඹුව

[1](2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කල්පිත හෝ අනිවාර්ය විශ්‍රාම යාමේ දිනයට පෙරාතුව තනතුර අවලංගු කිරීම මත රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන ඇති සහ අරමුදලට දායක වීම නතර කර ඇති යම් නිලධරයකු විසින් ඒ විශ්‍රාම ගැනීමේ දිනයට පසුව එකී නිලධරයා විසින් ගිවිස ගත් විවාහයක් සම්බන්ධයෙන්, ඔහු විශ්‍රාම ගිය දින සිට වයස අවුරුදු පනස්පහ එළඹෙන තෙක් අරමුදලට දායක මුදල් ගෙවීම දිගටම සිදුකරනු ලැබිය හැකි ය.

44. මෙම ආඥාපනත ආරම්භ වීමෙන් අනතුරුව මියගිය රාජ්‍ය නිලධාරියෙකුගේ වැන්දඹුවට හෝ දරුවෙකුට හෝ මෙම ආඥාපනතේ හෝ රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවනට හා දරුවනට විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළව වෙනත් නීති ප්‍රඥප්තියක්

විශ්‍රාම වැටුපෙන් බුදල් බදු අය නොකළ යුතුය.

වෙතොත් ඒවායේ විධිවිධාන යටතේ හෝ ලැබෙන කිසිම විශ්‍රාම වැටුපක් බූදල් බදු ආඥාපනත යටතේ කිසිම බද්දකට යටත් නොවිය යුත්තේ ය.

45. ලංකාවට වඩා අඩු හෝ වැඩි සුබදායක දේශගුණයක වාසය කිරීම නිසා, වැන්දඹුවකට හෝ දරුවකුට හෝ දරුවනට හෝ ගෙවිය යුතු විශ්‍රාම වැටුප, අඩු වැඩි නොවිය යුත්තේ ය.

පදිංචි ප්‍රදේශය අනුව විශ්‍රාම වැටුප වෙනස් නොවිය යුතු බව.

46. (1) විශ්‍රාම ගැනීමෙන් හෝ වෙනත් විධියකින් හෝ අවිවාහකයෙකු රාජ්‍යසේවයෙන් ඉවත් වූ විටෙක, ඔහු විසින් අරමුදලට ගෙවා ඇති දායක මුදලෙන් අඩක් පොළියක් රහිතව ඔහුට ආපසු ගෙවිය හැක්කේ ය. එයින් අනතුරුව එම අවිවාහකයාට හෝ ඔහු වෙනුවෙන් හෝ ඔහු යටතේ හෝ ඔහු මඟින් හෝ අයිතිකම් ඉල්ලන වෙනත් කිසිවෙකුට හෝ එහිලා කිසිම අයිතියක් නැත්තේ ය.

අවිවාහකයන්ගේ දායක මුදල ආපසු ගෙවිය හැකි බව.

(2) රාජ්‍ය සේවයෙහි සිටියදී අවිවාහකයෙකු මියගියහොත් ඔහු එතෙක් මුදලට ගෙවා ඇති දායක මුදලින් අඩක් පොළියකින් තොරව ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට ගෙවිය හැක්කේ ය.

[1]2010 අගෝස්තු මස 20 වැනි දින 2010 අංක 08 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

47. නියමිත දින හෝ එදිනට පසුව, විශ්‍රාම ගැනීමෙන් හෝ වෙනත් විධියකින්, අවිවාහකයෙකු රාජ්‍ය සේවයෙන් ඉවත් වීම හෝ රාජ්‍ය සේවයෙහි සිටියදීම මියයාම වැනි සිද්ධියකදී 46 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

46 වන වගන්තියේ බලපෑම

48. (1) විශ්‍රාම ගැනීමෙන් හෝ වෙනත් විධියකින් හෝ මෙම ආඥාපනත අනුව දායකමුදල් ගෙවන අවිවාහකයෙකු, නියමිත දින හෝ ඉන්පසු දිනක හෝ රාජ්‍ය සේවයෙන් ඉවත් වූ විටෙක, ඔහු අරමුදලට දායකමුදල් ගෙවීම නතර කළ යුතු අතර එතෙක් ඔහු විසින් මෙම ආඥාපනත යටතේ අරමුදලට දායක වී ඇති සියලුම මුදල් වර්ෂයට සියයට 21/2 ක වැල් පොළියකුත් සමඟ ඔහුට ආපසු ගෙවිය යුත්තේ ය.

අවිවාහකයන්ගේ දායක මුදල්

(2) මෙම ආඥාපනත යටතේ දායකමුදල් ගෙවීමේ උපරිම කාල සීමාව ඉක්ම යාම නිසා අවිවාහක දායකයෙකු රාජ්‍ය සේවයේ සිටියදීම, නියමිත දිනට පෙරාතුව දායක මුදල් නතර කළ විටෙක එසේ ඔහු විසින් මෙම ආඥාපනත

අවිවාහකයන්ගේ දායක මුදල්

යටතේ එතෙක් ගෙවා ඇති දායක මුදලින් අඩක් පොළී රහිතව ඔහුට ආපසු ගෙවිය යුත්තේ ය.

[1](3) නියමිත දින හෝ ඊට පසු එහෙත් අදාළ දිනට පෙර, රජයේ සේවයේ යෙදී සිටිය දී තමාගේ දායකවීමේ උපරිම කාල සීමාව ඉකුත්වීමේ හේතුවෙන් යම් අවිවාහකයකු මේ ආඥාපනත යටතේ දායකවීම අවසන් කරන අවස්ථාවක මේ ආඥාපනත යටතේ ඔහුගේ දායක මුදල් මුළුමනින්ම ඊට අවුරුද්දකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොලිය සමඟ ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(4) අවිවාහකයෙකු මෙම ආඥාපනතේ 31 වන වගන්තිය යටතේ කැමැත්ත පළ කළ යුතු මුත් එසේ කැමැත්ත පළ කිරීමට අසමත් වී එම නිසාම නියමිත දින හෝ ඊට පසුව හෝ දායක මුදල් ගෙවීම නතර කළ විටෙක ඔහු විසින් එම මුදල් ආපසු ඉල්ලා ලිඛිත ඉල්ලීමක් කරනු ලැබුවහොත් ඔහු මෙම ආඥාපනත යටතේ එතෙක් ගෙවා ඇති මුළු දායක මුදලම වර්ෂයට සියයට 21/2 ක වැල් පොළියකුත් සමඟ ඔහුට ආපසු ගෙවිය යුත්තේ ය.

(5) මෙම වගන්තියේ ඉහත දැක්වූ කිසියම් උප වගන්තියක් යටතේ එබඳු මුදල් ආපසු ලබා ගැනීමේ හිමිකම ඇති යම් අවිවාහකයෙකු මුදල් ආපසු ලබා ගැනීමට පෙර මියගිය විටෙක ඔහුට ලැබිය යුතු මුදල ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයෙකුට, උරුමකරුවෙකුට හෝ උරුමකරුවනට හෝ ආපසු ගෙවිය යුත්තේ ය.

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

(6) මෙම ආඥාපනත යටතේ දායක මුදල් ගෙවමින් සිටින දායකයෙකු නියමිත දින හෝ ඊට පසු දිනක හෝ මියගිය හොත් මෙම ආඥාපනත යටතේ ඔහු විසින් ගෙවා ඇති මුළු දායක මුදල වර්ෂයට සියයට 21/2 ක වැල් පොළියකුත් සමඟ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට උරුමකරුට හෝ උරුමකරුවනට ආපසු ගෙවිය යුත්තේ ය.

විශ්‍රාම වැටුප් හිමි දරුවන් නැති වැන්දඹු පුරුෂයාගේ දායක මුදල්.

49. (1) (අ) විශ්‍රාම වැටුප් ලැබිය හැකි, දරුවන් නොමැති දායක වැන්දඹු පුරුෂයකු විශ්‍රාම වැටුප් ඇතිව රාජ්‍ය සේවයෙන් විශ්‍රාමගත් විටක ද

(ආ) විශ්‍රාම වැටුපක් ලැබිය නොහැකි දරුවන් ඇති දායක වැන්දඹු පුරුෂයකු ඉල්ලා අස් වීමෙන්, මාරු වී යාමෙන් හෝ වෙනත් විධියකින් රාජ්‍ය සේවයෙන් ඉවත් වූ විටෙක ද

(ඇ) විශ්‍රාම වැටුපක් ලැබිය හැකි දරුවන් නොමැති දායක වැන්දඹු පුරුෂයෙකු රාජ්‍ය සේවයෙහි යෙදී සිටිය දී මියගිය විටෙක ද

ඔහුට ආපසු ගෙවිය යුතු දායක මුදලෙන් සියයට පනහක ප්‍රමාණය, ප්‍රස්ථාවානුකූලව, දායකයාට හෝ දායකයාගේ නීත්‍යානුකූල පෞද්ගලික නියෝජිතයාට හෝ පොළී මුදල රහිතව ආපසු ගෙවිය යුත්තේ ය. එතෙකුදු වුවත්, මෙම වගන්තිය යටතේ සිය අයිතිවාසිකම පාවිච්චි කිරීමට තෝරාගත් දායකයෙකුගේ අරමුදලේ දායකකම නතරවිය යුතුවා පමණක් නොව ඉන්පසු ඒ සඳහා වෙනත් කිසිඳු අයිතියක් ද නොලැබිය යුත්තේ ය. (1947.24.11)

(2) විශ්‍රාම වැටුපක් ඇතිව විශ්‍රාම ගන්නා දායකයෙක් පසුකලෙක විශ්‍රාම වැටුපක් ලැබිය හැකි දරුවන් නැති වැන්දඹු පුරුෂයෙකු වුවහොත් අරමුදලට දායක මුදල් ගෙවීම නතර කිරීමට කැමැත්ත පල කළ හැකි අතර ඉන්පසු ඒ සම්බන්ධයෙන් තවදුරටත් අයිතිවාසිකම් ඉදිරිපත් කළ නොහැක්කේ ය.

(3) මෙම වගන්තිය යටතේ කිසියම් දායකයෙක් සිය අයිතිය පාවිච්චි කිරීමට කැමැත්ත පල කරන්නේ නම් අයිතිය පරිණත වූ දිනයේ සිට සහ මසක් ඇතුළත එසේ කළ යුත්තේ ය. එසේ කැමැත්ත පල කිරීම අවසාන කැමැත්ත පල කිරීම වන්නේ ය.

[1]149අ. (1) මේ ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තියේ ක්‍රියාත්මක වන දිනයේ දී හෝ ඉන්පසුව, දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු වන දායකයකු - ඇතැම් අවස්ථාවල සියලුම දායක මුදල් ආපසු ගෙවීම.

(අ) විශ්‍රාම වැටුප් පිට රජයේ සේවයෙන් විශ්‍රාම ලබන්නා වූ ; හෝ

(ආ) ඉල්ලා අස්වීමෙන්, මාරු කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් රජයේ සේවයෙන් ඉවත්ව යන්නා වූ ; හෝ

(ඇ) රජයේ සේවයේ සිටින අතරතුර මිය යන්නා වූ

අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ දායකයා හෝ ඒ දායකයාගේ පෞද්ගලික නෛතික නියෝජිතයා, ඒ දායකයාගේ සියලුම දායක මුදල්, ඒ මත වර්ෂයකට සියයට දෙකහමාරක වැල් පොලිය ද සමඟ, ආපසු ලබා ගැනීමට හිමිකම ලැබිය යුතු ය:

එසේ වුව ද, වයස අවුරුදු පනස් පහට එළඹීමට පෙර, රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ හෝ ඉවත් වූ දායකයකු ඒ වයසට එළඹෙන තුරු ඒ ආපසු ගෙවීමට හිමිකම නොලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ ආපසු ගෙවීමක් ලබන යම් දායකයකුට අරමුදලින් තවදුරටත් කිසිම හිමිකම් පෑමක් කළ නොහැකි විය යුතු ය.

(3) මේ ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනට පෙරාතුව යම් දායක මුදලක් ආපසු ගෙවනු ලැබූ (1) වන උපවගන්තියේ සඳහන් යම් දායකයකු විසින්, එකී දිනයේ සිට එක් අවුරුද්දක් ඇතුළත, ඒ මුදල, ඒ මත වර්ෂයකට සියයට දෙකහමාරක වැල් පොලිය සමඟ ආපසු ගෙවන්නේ නම් පමණක්, මේ වගන්තියේ වාසිය සඳහා හිමිකම් පෑ හැකි ය.

---

[1]1998 දෙසැම්බර් මස 18 වැනි දින 1998 අංක 57 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත

50. නියමිත දින හෝ ඉන් අනතුරුව හෝ කිසියම් දායකයෙක්

49 වන වගන්තියේ බලපෑම (1947.25.1)

(අ) විශ්‍රාම වැටුප් ලැබිය හැකි දරුවන් නොමැතිව විශ්‍රාම ගෙන හෝ වෙනත් විධියකින් හෝ රාජ්‍ය සේවයෙන් ඉවත් වන්නේ නම් හෝ සේවයෙහි යෙදී සිටියදීම මිය යන්නේ නම් හෝ

(ආ) විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් පසු වැන්දඹු පුරුෂයෙකු වන්නේ නම් හෝ 49 වන වගන්තියේ විධිවිධාන අනුව එම දායකයා කෙරෙහි බලනොපාන්නේ ය.

[1]51. (1) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු විසින්, 49 වන වගන්තිය යටතේ තම අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමට අසමත් වීමේ හේතුවෙන් මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවීම අවසන් කරනු නොලබන අවස්ථාවක-

(අ) නියමිත දිනයට පසුව එහෙත් අදාළ දිනයට පෙර යම් අවස්ථාවක ඔහු මිය යයි නම් හෝ ඒ දායක මුදල් ගෙවීම අවසන් කිරීමට තෝරා ගනියි නම් ; හෝ

(ආ) ඔහු ඒ දායක මුදල් ගෙවීම නොකඩවා ම කරගෙන යන්නේ නම්, සහ ඔහුගේ දායක මුදල් ගෙවීමේ උපරිම කාල සීමාව ඉකුත් වී යාමෙන් හෝ ඔහුගේ මරණය සිදුවීමේ හේතුවෙන්, එසේ කිරීම අවසන් කරයි නම්,

අවස්ථාවෝචිත පරිදි ඒ මරණය, තෝරා ගැනීම හෝ කාලය ඉකුත් වී යාම සිදු වූ දිනයේ දී මේ ආඥාපනත යටතේ නියමිත දිනයේ දී හෝ එයට පසුව ඔහු විසින් කරන ලද ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම, ඊට අවුරුද්දකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොලියත් සමඟ, ආපසු ගෙවීමක් කරනු ලැබිය යුතු ය.

තව ද එසේ කළ යුතු ආපසු ගෙවීම, ඒ කාර්යය සඳහා කරන ලද ලිඛිත ඉල්ලීමක් මත, ඒ වැන්දඹු පුරුෂයා ජීවත්ව සිටී නම් ඔහුට හෝ ඔහු මිය ගොස් නම් ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට හෝ උරුමක්කරුට හෝ උරුමක්කරුවන්ට හෝ කරනු ලැබිය යුතු ය.

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](2) මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවන තැනැත්තකු නියමිත දිනයේ දී හෝ ඊට පසු--

(අ) විශ්‍රාම වැටුප සඳහා හිමිකම් සහිත දරුවන් නොමැතිව වැන්දඹු පුරුෂයකුව සිටිය දී රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා හෝ අන් ආකාරයකින් රජයේ සේවය හැර යන අවස්ථාවක ; හෝ

(ආ) ඒ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් හෝ අන් ආකාරයකින් සේවය හැර යාමෙන් පසු වැන්දඹු පුරුෂයකු බවට පත් වන අවස්ථාවක--

(i) නියමිත දිනයට පසුව එහෙත් අදාළ දිනයට පෙර යම් අවස්ථාවක ඔහු මිය යයි නම් හෝ ඒ දායක මුදල් ගෙවීම අවසන් කිරීමට තෝරා ගනියි නම් : හෝ

(ii) ඔහු ඒ දායක මුදල් ගෙවීම නොකඩවා කරයි නම් සහ, ඔහුගේ දායක මුදල් ගෙවීමේ උපරිම කාලසීමාව ඉකුත්වීමෙන් හෝ ඔහුගේ මරණය සිදුවීමෙන් අදාළ දිනයේ දී හෝ එදිනට පෙර එසේ දායක මුදල් ගෙවීම අවසන් කරයි නම්,

අවස්ථාවෝචිත පරිදි, ඒ තෝරා ගැනීම, කාලය ඉකුත්වීම හෝ මරණය සිදු වූ දිනයේ දී, ඔහුගේ ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම, ඊට අවුරුද්දකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොලියත් සමඟ ආපසු ගෙවීමක් කරනු ලැබිය යුතු ය.

තව ද එසේ කළ යුතු ආපසු ගෙවීම, ඒ කාර්යය සඳහා කරන ලද ලිඛිත ඉල්ලීමක් මත, ඒ වැන්දඹු පුරුෂයා ජීවත්ව සිටී නම්, ඔහුට හෝ ඔහු මිය ගොස් නම් ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට හෝ උරුමක්කරුට හෝ උරුමක්කරුවන්ට හෝ කරනු ලැබිය යුතු ය.

(2අ) අදාළ දිනයට පෙර දායකයකුව සිට ඇති රජයේ නිලධරයකු ඒ අදාළ දින හෝ ඊට පසුව--

(අ) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම සහිත දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකුව සිටිය දී රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා හෝ අන් ආකාරයකින් රජයේ සේවය හැර යන අවස්ථාවක, හෝ

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](ආ) ඒ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් හෝ අන් ආකාරයකින් ඒ සේවය හැර යාමෙන් පසු එසේ වැන්දඹු පුරුෂයකු බවට පත්වන අවස්ථාවක, හෝ

(ඇ) රජයේ සේවයේ යෙදී සිටිය දී සහ විශ්‍රාම වැටුප් සඳහා හිමිකම සහිත දරුවන් නොමැතිව වැන්දඹු පුරුෂයකුව සිටිය දී මිය යන අවස්ථාවක,

අවස්ථාවෝචිත පරිදි, ඔහු හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා හෝ උරුමක්කරු හෝ උරුමක්කරුවන්, අවුරුද්දකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොලියත් සමඟ, ඔහුගේ ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම ආපසු ගෙවීමකට හිමිකම් ලැබිය යුතු ය.

(2ආ) රජයේ නිලධරයකු අදාළ දිනයේ දී හෝ ඊට පසු දායකයකු බවට පත් වන අවස්ථාවක හා--

(අ) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැතිව වැන්දඹු පුරුෂයකුව සිටිය දී රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා හෝ රජයේ සේවය හැර යන අවස්ථාවක, හෝ

(ආ) රජයේ සේවයේ යෙදී සිටිය දී සහ විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැතිව වැන්දඹු පුරුෂයකුව සිටිය දී මිය යන අවස්ථාවක,

ඔහු හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා හෝ උරුමක්කරු හෝ උරුමක්කරුවන්, මේ ආඥාපනත යටතේ ඔහුගේ ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම, පොලියක් නොමැතිව, ආපසු ලබා ගැනීමකට හිමිකම් ලැබිය යුතු ය.

(3) විශ්‍රාම වැටුප් හිමි දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු දායක මුදල් ගෙවීමේ උපරිම කාල සීමාව ඉක්මයාම නිසා රාජ්‍ය සේවයෙහි සිටියදීම නියමිත දිනට පෙරාතුව මෙම ආඥාපනත යටතේ දායක මුදල් ගෙවීම නතර කළහොත් ඔහුගේ ආපසු ගෙවිය යුතු මුදලෙන් අඩක් පොළී රහිතව ඔහුට ආපසු ප්‍රදානය කළ යුත්තේ ය.

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](4) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැති දරුවන් වැන්දඹු පුරුෂයකු, රජයේ සේවයේ යෙදී සිටිය දී, තම දායකවීමේ උපරිම කාල සීමාව ඉකුත්වීම හේතු කොට ගෙන, නියමිත දින හෝ ඊට පසු එහෙත් අදාළ දිනයට පෙර, මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවීම අවසන් කරන අවස්ථාවක, අවුරුද්දකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොළියත් සමඟ, ඔහුගේ ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම ආපසු ගෙවීමක් ඔහුට කරනු ලැබිය යුතු ය.”

(5) විශ්‍රාම වැටුප් හිමි දරුවන් නොමැති, මෙම ආඥා පනතේ 13 වන වගන්තිය හෝ 15 වන වගන්තියේ ව්‍යතිරේකය යටතේ කැමැත්ත ප්‍රකාශ කළයුතු වැන්දඹු පුරුෂයෙක් නියමිත දින හෝ ඉන් පසු හෝ එසේ කැමැත්ත ප්‍රකාශ කිරීමට අපොහොසත්ව එහෙයින් දායක මුදල් ගෙවීම නතර කර ඇතොත් එම දායක මුදල් ආපසු ඉල්ලා ලිඛිතව කරන ඉල්ලීමක් උඩ ආපසු ගෙවිය යුතු මුළු මුදල වර්ෂයට සියයට 21/2 ක වැල් පොළියකුත් සමඟ ඔහුට ආපසු ගෙවිය යුත්තේ ය. (1953 හා 6.33)

(6) විශ්‍රාම වැටුප් හිමි දරුවන් නොමැති, වැන්දඹු පුරුෂයෙක් මෙම වගන්තියේ ඉහතින් දැන්වූ කිසියම් උප වගන්තියක් යටතේ ආපසු ලබා ගැනීමට හිමිකම තිබෙන දායක මුදලක් ආපසු නොලබාම මියගිය හොත් ආපසු දිය යුතු මුදල ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට හෝ උරුමකරුවකුට හෝ උරුමකරුවනට හෝ ආපසු ගෙවිය යුත්තේ ය.

[1](7) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු රජයේ සේවයේ යෙදී සිටිය දී සහ මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවමින් සිටිය දී, නියමිත දින හෝ ඊට පසු එහෙත් අදාළ දිනයට පෙර දිනයක මිය යන අවස්ථාවක, අවුරුද්දකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොලියත් සමඟ, ඔහුගේ ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට හෝ උරුමකරුට හෝ උරුමකරුවන්ට ගෙවනු ලැබිය යුතු ය.

(8) විශ්‍රාම වැටුප් ලැබිය හැකි දරුවන් නොමැති, වැන්දඹු පුරුෂයෙක් මෙම ආඥාපනත යටතේ ගෙවිය යුතු දායක මුදල් ගෙවීම නතර කිරීමට මෙම වගන්තියේ 1 හා 2 උපවගන්ති යටතේ කැමැත්ත ප්‍රකාශ කළේ නම් ඒ අවසාන කැමැත්ත විය යුත්තේ ය.

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1]51අ.(අ) අදාළ දිනයේ දී හෝ ඊට පසු දායකයකු වන්නා වූ;

(ආ) අවිවාහකයකු නොවන්නා වූ,

යම් රජයේ නිලධරයකු රජයේ සේවයෙන් ඉවත් වන විටෙක, ඔහු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපකට සුදුසුකම් නොලබන්නේ

අදාළ දිනයට හෝ ඉන්පසුව දායකයන් බවට පත්වන සහ විශ්‍රාම වැටුපක් නොමැතිව රාජ්‍ය සේවය හැර යන විවාහක රාජ්‍ය සේවකයන්ට අදාළ කරගත හැකි විශේෂ විධිවිධාන.

නම්, ඔහුට ඔහු විසින් ගෙවන ලද මුළු දායක මුදල හෝ ඉන් කොටසක් හෝ ප්‍රදානය නොකළ යුතු ය. එනමුත්, ඔහු සේවයෙන් ඉවත් වීමට පෙරාතුව වූ,

එසේ වුව ද, ඔහු සේවයෙන් ඉවත් වීමට පෙරාතුව ඒ සේවයේ වසර දහයක් හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇත්නම් ඔහුගේ මරණින් පසු ඔහුගේ වැන්දඹුව හා අනත් දරුවන් ඔහු විසින් ගෙවන ලද දායක මුදල්වල පදනම මත මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය.

52. මෙම ආඥාපනත යටතේ ගෙවූ දායක මුදල් වලින් යම් දායක මුදලක් 48 හා 51 වගන්ති යටතේ ආපසු ගෙවන විටකදී පොළිය ගණනය කළ යුත්තේ මුදල ආපසු ගෙවන දිනය දක්වා නොවන්නේය. එසේම, ගෙවන ලද දායක මුදලට අනුව විශ්‍රාම වැටුප ගණනය කිරීමේ කාර්යයන් සඳහා යම් දායකයකු විසින් ඔහුගේ අවිවාහක සමයේ දී ගෙවන ලද දායක මුදලට ගෙවිය යුතු වැල් පොළිය ගණනය කළේ නම් පිළිවෙලකට ද එම පිළිවෙලටම මෙහිදී ද වැල් පොළිය ගණන් බැලිය යුත්තේ ය. (1947.25.11) (වැල් පොළිය ගණනය කළ යුතු අවස්ථා) 48 හා 51 වගන්ති

53. මේ ආඥා පනතේ මීට පටහැනිව කුමක් සඳහන්ව තිබෙතත් 1906 මාර්තු 14 දිනට පසුව පත් කරන ලද කිසිම රාජ්‍ය නිලධාරියෙකුට මෙම අරමුදලේ දායකයන් වීමට ඉඩ නොදිය යුත්තේ ය. එහෙත් මේ ආඥා පනතේ විධිවිධාන යටතේ ඔවුන්ගෙන් අයකර ගත යුතුව තිබෙන දායක මුදල් හා වෙනත් ගෙවීම් වලට සමාන මුදලක් එබඳු නිලධාරීන්ගේ වැටුප් වලින් හෝ විශ්‍රාම වැටුප් වලින් අඩුකොට ලංකාවේ පොදු ආදායම් ගිණුම් වලට බැර කළ යුත්තේ ය. (1906.03.14 ට පසු පත්වීම් ලද අය ගැන)

එතෙකුදු වුවත් එසේ ලබාගන්නා මුදල් 1898 ආරක්ෂක දායක ආඥාපනත යටතේ යුද්ධ කටයුතු දායක මුදල් ලෙස ගණන් නොගත යුත්තේ ය.

---

[1]2010 අගෝස්තු මස 20 වැනි දින 2010 අංක 08 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

නියමිත දින හෝ ඊට පසුව ප්‍රථම වතාවට විවාහ වූ දායකයෙකුට මෙම ආඥා පනත යටතේ ගෙවිය හැකි විශ්‍රාම වැටුප ගණනය කිරීමද,

1945 අගෝස්තු 03 වන දින ආණ්ඩුකාරවරයා විසින් අනුමත කොට ඇති වගු හෝ 1922 පෙබරවාරි 27 වන දින ආණ්ඩුකාරවරයා විසින් අනුමත කොට ඇති වගු හෝ දෙකෙන් වැඩි විශ්‍රාම වැටුප ගෙන දෙන වගු අනුව කළ යුත්තේ ය.

තවද, (1) උපලේඛනයෙන් 1 (අ) නීතියේ විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද 1906 මාර්තු 14 වන දිනට පසුව පත්වූ අවිවාහකයෙකු වශයෙන්ම දායක මුදල් ගෙවීම ඇරඹූ රාජ්‍ය නිලධාරියෙකුට ගෙවිය යුතු වන විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී කාර්යයන් සඳහා ඔහු විසින් අවිවාහක කාල පරිච්ඡේදය තුළ ගෙවා ඇති දායක මුදලට පොළිය ගණන් බැලීමේදී:-

(අ) 1919 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ කිනම් කාල පරිච්ඡේදයකට වුව ද වර්ෂයට සියයට හය බැගින්ද,

(ආ) 1920 ජනවාරි 01 වන දින හෝ ඉන්පසු දිනකින් හෝ ආරම්භ වී නියමිත දිනෙන් අවසන් වන කිනම් කාලපරිච්ඡේදයකට වුව ද වර්ෂයට සියයට අට බැගින් ද,

(ඇ) නියමිත දින හෝ ඉන්පසු දිනයකින් ඇරඹෙන කවර කාලපරිච්ඡේදයකට වුව ද වර්ෂයට සියයට හය බැගින්ද වැල් පොළිය ගෙවිය යුත්තේ ය.

(2) ඉහත කී වගු, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තක්සේරුකරුවෙක් හෝ තක්සේරුකරුවන් විසින් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඇතිව කලින් කලට යථායෝග්‍ය හා ප්‍රතිශෝධනය කළ යුත්තේ ය. එසේ යථායෝග්‍ය කරන ලද හෝ ප්‍රතිශෝධනය කරන ලද වගු විසින් එතෙක් පැවති වගු ආදේශ කළ යුතු අතර එම වගු ආණ්ඩුකාරවරයා විසින් නියම කෙරෙන දිනක සිට වලංගු විය යුත්තේය. එසේම, එම වගු එදින හෝ ඊට පසුව මියගිය දායකයකු වෙනුවෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප සඳහා පමණක් යොදාගත යුතු වන අතර, එදිනට පෙර මිය ගිය අය වෙනුවෙන් ගෙනෙන කිසිදු විශ්‍රාම වැටුපක් වෙනුවෙන් නොයෙදිය යුත්තේ ය.

54. 53 වන වගන්තියේ විධිවිධානයන් විසින් වෙනස් නොකරන තාක්දුරට මෙම ආඥා පනතේ විධිවිධානයන් 1906 මාර්තු 14 වන දිනට පසුව පත් වූ රාජ්‍ය නිලධාරීන් කෙරෙහි ද අදාළ විය යුත්තේය.

(මෙම පනතේ විධිවිධාන එබඳු නිලධාරීන් කෙරෙහි යෙදවීම.)

55. දැනට සිටින රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් වැඩි වීම් වෙනුවෙන් 1906 මාර්තු 14 වන දිනට පසුව එකතු වන විශ්‍රාම වැටුප්, මෙහි (11) වන උපලේඛනයේ වගු අනුව ගණනය කළ යුත්තේ ය.

(දැනට සිටින නිලධාරීන්ගේ වැටුප් වැඩිවීම් මත විශ්‍රාම වැටුප් )

56. රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවන්ගේ හා අනාථ දරුවන්ගේ විශ්‍රාම වැටුප්, මෙහි (11) උපලේඛනයේ වගු අනුව ගණනය කිරීමේ දී (1) උපලේඛනයේ ඇති නීතිද සැළකිල්ලට ගත යුත්තේ ය.

(විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ නීතිරීති)

[1]57. 57අ වගන්තියේ විධිවිධානවලට යටත්ව, 1906 මාර්තු මස 14 දිනට පසුව පත් කරනු ලැබ මිය ගිය රජයේ නිලධරයනුගේ වැන්දඹුවන් හෝ අනත්දරුවන් හිමිකම් ලබන විශ්‍රාම වැටුප්-

(අ) II වන උපලේඛනයේ සඳහන් චක්‍රවලට අනුව 1919 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා ;

(ආ) 1922 පෙබරවාරි මස 27 වන දින ආණ්ඩුකාරවරයා විසින් අනුඥාත චක්‍රවලට අනුව, නියමිත දින ආරම්භ වන කාල සීමාව සඳහා ;

(ඇ) 1945 අගෝස්තු මස 3 වන දින ආණ්ඩුකාරවරයා විසින් අනුඥාත චක්‍රවලට අනුව, නියමිත දින ආරම්භ වන කාලසීමාව සඳහා ;

ගණන් බැලිය යුතුව හා ගෙවිය යුතුව තිබූ සේ සලකනු ලැබිය යුතු ය.

අදාළ දිනයෙහි හෝ ඉන්පසු මියයන ඇතැම් රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වලට අදාළ විශේෂ විධිවිධාන.

57අ.(1) මේ වගන්තියේ පසුව එන විධිවිධාන, රජයේ සේවය හැර යාමෙන් පසු මේ ආඥාපනතේ 13 වන වගන්තිය යටතේ හෝ 15 වන වගන්තිය යටතේ හෝ අඛණ්ඩව දායකවී ඇත්තා වූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුපට අදාළ නොවිය යුතු ය.

(2) දායකයකු වන්නා වූ හෝ දායකයකු වී සිටි තැනැත්තකු අදාළ දිනයෙහි හෝ ඉන්පසු මිය යන අවස්ථාවක, මේ ආඥාපනත යටතේ ඒ තැනැත්තා සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප, මේ ආඥාපනතෙහි ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, පහත දැක්වෙන විධිවිධාන අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය :-

(අ) ඒ තැනැත්තා රජයේ සේවයේ යෙදී සිටිය දී හෝ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස එළඹීමට පෙර විශ්‍රාම ගෙන සිටිය දී හෝ ආයතන සංග්‍රහයේ දක්වා ඇති හේතු නොවන වෙනත් යම් හේතුවක් මත රජයේ සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබීමෙන් පසු හෝ මිය යන අවස්ථාවක, (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව ඒ විශ්‍රාම වැටුපෙහි මුදල් ප්‍රමාණය --

(i) අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ මරණය සිදුවන අවස්ථාවේ හෝ ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ හෝ ඔහුගේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය අවුරුදු විසිපහකට අඩුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විසිපස් අවුරුද්දක විශ්‍රාම වැටුප් හිමි සේවා කාලයක් සඳහා හෝ ඔහු මිය නොගියේ නම් හෝ විශ්‍රාම නොගත්තේ නම් අනිවාර්ය විශ්‍රාම යාමේ වයස එළඹීමේ දී ඔහු විසින් සම්පූර්ණ කළ හැකිව තිබූ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලයක් සඳහා හෝ යන දෙකින් වඩා කෙටි කාලය සඳහා ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය ;

(ii) අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ මරණය සිදුවන අවස්ථාවේ හෝ ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ හෝ ඔහුගේ විශ්‍රාම වැටුප් හිමි සේවාකාලය අවුරුදු විසිපහකට අඩු නොවේ නම්, එම විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය :

එසේ වුව ද ඒ තැනැත්තා ඔහුගේ මරණය සිදුවන අවස්ථාවේ හෝ ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ විශේෂ තනතුරක් හෝ ධුරයක් දරන්නකු වී නම් ඒ විශ්‍රාම වැටුප් ප්‍රමාණය ඔහුගේ අවසාන වැටුපෙන් සියයට පනහකට අඩු නොවිය යුතු ය.

---

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](ආ) ඒ තැනැත්තා අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස එළඹීමේ හේතුව මත හෝ ආයතන සංග්‍රහයේ දක්වා ඇති යම් හේතුවක් මත හෝ රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබීමෙන් පසු හෝ විශ්‍රාම ගන්වනු ලැබීමෙන් පසු හෝ මියයන අවස්ථාවක, (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, ඒ විශ්‍රාම වැටුප ඔහුගේ විශ්‍රාම වැටුප් හිමි සේවා

කාලය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

(ඇ) ඒ තැනැත්තා අදාළ දිනයට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ හෝ විශ්‍රාම ගන්වනු ලැබූ හෝ අවස්ථාවක, ඒ විශ්‍රාම වැටුප මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය හෝ ඒ විධිවිධාන නොමැති වූයේ නම් මේ ආඥාපනත යටතේ ගෙවිය හැකිව තිබූ මුදල් ප්‍රමාණය හෝ යන දෙකෙන් වැඩි එක විය යුතු ය.

(ඈ) ඒ තැනැත්තා ආණ්ඩුවේ අනුමතය ඇතිව ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ස්ථිර ලෙස පත් කරනු ලැබීමෙන් පසු ඔහු ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙහි හෝ ඔහු පසුව මාරුකරන හරින ලද වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සේවයෙහි යෙදී සිටිය දී හෝ මිය යන අවස්ථාවක හෝ ආණ්ඩුවේ සේවයෙහි සිට ඔහු පත් කරන ලද්දේ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ද ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙන් හෝ ඔහු පසුව මාරු කර හරින ලද්දේ වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ද ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙන් හෝ විශ්‍රාම වැටුප් හිමි තත්ත්වයන් යටතේ විශ්‍රාම ගනු ලැබූ පසු හෝ විශ්‍රාම ගන්වනු ලැබූ පසු හෝ මිය යන අවස්ථාවක, (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, ඒ විශ්‍රාම වැටුප් ප්‍රමාණය--

(i) ඔහු අදාළ දිනයට පෙර රජයේ සේවය හැර ගියේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ඔහුගේ විශ්‍රාම වැටුප් හිමි සේවාව සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදල් ප්‍රමාණයක් හෝ මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන නොමැති වූයේ නම් මේ ආඥාපනත යටතේ ගෙවිය හැකිව තිබූ මුදල් ප්‍රමාණය හෝ යන දෙකෙන් වැඩි එක විය යුතු ය, හෝ

(ii) ඔහු අදාළ දිනයේ හෝ ඉන්පසු හෝ රජයේ සේවය හැර ගියේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

(2) මේ වගන්තියේ--

"අනිවාර්ය විශ්‍රාම යාමේ වයස" යන්නෙන්, රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වන විට එම නිලධරයා රජයේ සේවයෙන් විශ්‍රාම යාම අනිවාර්ය වන්නේ යම් වයසක ද ඒ වයස අදහස් වේ ;

"විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු මූලික විශ්‍රාම වැටුප" යන්නට මේ ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු යම් දේශගුණ ප්‍රසාද දීමනාවක් ද, වෙනත් යම් විශ්‍රාම වැටුප් හිමි දීමනා ද ඇතුළත් වන නමුත් මේ ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට වෙනත් යම් එකතු කිරීමක් හෝ ඒ විශ්‍රාම වැටුපේ කරන ලද යම් අඩු කිරීමක් ඇතුළත් නොවේ ;

"අවසාන වැටුප" යන්නෙන්--

(අ) රජයේ සේවයෙහි යෙදී සිටිය දී මිය යන රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වන විට ඔහුගේ මරණය සිදු වන අවස්ථාවේ දී නිලධරයා ලැබූ වැටුප අදහස් වේ ; තව ද

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](ආ) රජයේ සේවය හැර ගිය පසු මිය යන රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ අවස්ථාවේ හෝ ඔහු රජයේ සේවයෙන් මුදා හරින ලද අවස්ථාවේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක ස්ථිර

පත්වීමක් සඳහා ඔහු රජයේ සේවයෙන් මුදා හරින ලද අවස්ථා වේ හෝ එම නිලධරයා ලැබූ වැටුප අදහස් වේ :

"විශ්‍රාම වැටුප් හිමි අවස්ථා" යන්නෙන් වයස, රෝගාතුර වීම, ධුරය අහෝසි කිරීම යන හේතු හෝ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් හෝ අදහස් වේ ;

"විශ්‍රාම වැටුප් හිමි සේවය" යන්නෙන් රජයේ නිලධරයා විසින් නියම වශයෙන් ඉටු කරනු ලබන සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් සඳහා වූ සේවයක් ලෙස සලකනු ලබන යම් සේවාවක් අදහස් වන නමුත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වලින් සලසා ඇති යම් විශේෂ සේවාවක් ඊට ඇතුළත් නොවේ ;

"විශේෂ තනතුර හෝ ධුරය" යන්නෙන්--

(අ) ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයාගේ තනතුර හෝ ධුරය හා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල "ක" උපලේඛනයේ සඳහන් කරන ලද වෙනත් යම් තනතුරක් හෝ ධුරයක් ; හා

(ආ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 25ඇ වගන්තියේ අර්ථානුකූලව අධිකරණ නිලධරයකු වන තැනැත්තකු විසින් දරනු ලබන යම් තනතුරක් හෝ ධුරයක්

අදහස් වේ ;

"ව්‍යවස්ථාපිත මණ්ඩලය" යන්නට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 48අ වගන්තියේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ; තව ද

"මාරුකර හරින ලදී" යන්නට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 48ආ වගන්තියේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

මේ ආඥාපනත යටතේ විශ්‍රාම වැටුප් හිමි සේවාවේ කොටසක් සම්බන්ධයෙන් දායකමුදල් නොගෙවන ලද රජයේ නිලධරයන්ට අදාළ විශේෂ විධිවිධාන.

57ආ. (1) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයකු වන යම් තැනැත්තකු අදාළ දිනයෙහි හෝ ඉන්පසු මේ ආඥාපනත යටතේ දායකයකු වන අවස්ථාවක, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අධ්‍යක්ෂවරයා විසින් එම ආඥාපනත යටතේ ඒ තැනැත්තාට ගෙවිය යුතු මුදලින්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ අරමුදලට දායක වූ මුළු කාලය සඳහා ඒ දායකයාගේ වැටුප්වල මුළු එකතුවෙන් සියයට හතරකට සමාන මුදල් ප්‍රමාණයක් අඩු කළ යුතු ය. අඩු කරන ලද මුදල් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර, ඒ මුදල් ප්‍රමාණය අඩු කරන ලද්දේ යම් කාලයක් සම්බන්ධයෙන් ද, ඒ කාලය මේ වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා මේ ආඥාපනත යටතේ ඒ තැනැත්තා විසින් දායක මුදල් ගෙවනු ලැබූ කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

[1]1981 ජුලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

[1](2) විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුපේ පද නම මත ගණනය කරන ලද විට හා ඒ තැනැත්තාගේ විශ්‍රාම වැටුප් හිමි සේවයට මේ ආඥාපනත යටතේ දායක මුදල් නොගෙවන ලද යම් සේවයක්

ඇතුළත් වන විට, ඒ තැනැත්තා සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ දායක මුදල් නොගෙවන ලද යම් සේවයක් ඇතුළත් වන විට, ඒ තැනැත්තා සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ විශ්‍රාම වැටුප 57අ වගන්තිය යටතේ වන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තා සම්බන්ධයෙන් රජයෙන් ලැබිය යුතු යම් මුදල්වලින් ඒ තැනැත්තාගේ මුළු වැටුපෙන් සියයට හතරකට සමාන මුදලක් සමඟ මේ ආඥාපනත යටතේ දායක මුදල් නොගෙවනු ලැබූ මුළු කාලය සඳහා ඒ මුදලට වාර්ෂිකව සියයට හතරක පොලියක් අඩු කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකු විසින් දායක මුදල් නොගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් හිමි සේවයේ සම්පූර්ණ කාලය සඳහා හෝ කොටසක් සඳහා හෝ අධ්‍යක්ෂවරයා විසින් (2) වන උපවගන්තිය යටතේ යම් අඩු කිරීමක් කළ නොහැකි අවස්ථාවක, ඒ තැනැත්තා විසින් හෝ ඔහු ජීවතුන් අතර නොමැති අවස්ථාවක මේ ආඥාපනත යටතේ මුලින් සඳහන් තැනැත්තා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුපකට හිමිකම ඇති තැනැත්තා විසින් හෝ, ඔහු එසේ කිරීමට කැමැත්තේ නම් (2) වන උපවගන්තියේ නියමයන් යටතේ අඩු නොකරන ලද මුදල් ප්‍රමාණයට සමාන මුදල් ප්‍රමාණයක් අධ්‍යක්ෂවරයාට ගෙවනු ලැබිය හැකි ය. ඒ ගෙවීම නොකරන ලද්දේ නම්, මේ ආඥාපනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප, ගෙවීම නොකරන ලද්දේ යම් මාස සම්බන්ධයෙන් ද ඒ එක් එක් සම්පූර්ණ මාසයක් සම්බන්ධයෙන් ඒ විශ්‍රාම වැටුපෙන් 1/600 කින් අඩු කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "විශ්‍රාම වැටුප් හිමි සේවය" යන්නට 57අ වගන්තියේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

ඇතැම් ගුරුවරුන් සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

57ඇ. පාඨශාලා ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත යටතේ පිහිටුවනු ලැබූ (මේ වගන්තියෙහි මින් මතු "විශ්‍රාම වැටුප් අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායකයකු වූ යම් ගුරුවරයකු, 1970 අප්‍රේල් 1 වන දින පටන්, මේ ආඥාපනත යටතේ දායකයෙකු වී ඇති අවස්ථාවක, ඒ ගුරුවරයා විශ්‍රාම වැටුප් අරමුදලට දායක වූ කාලසීමාවන්, 57ආ වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, ඒ ගුරුවරයා විසින් මේ ආඥාපනත යටතේ ගෙවිය යුතු වූ පූර්ණ දායක මුදල් ගෙවනු ලැබූ කාලසීමාවන් වශයෙන් සැලකිය යුතු ය. ඒ ගුරුවරයා විසින් විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවනු ලැබූ දායක මුදල් ආණ්ඩුව විසින් ඒ ගුරුවරයා සම්බන්ධයෙන් එකී අරමුදලට ගෙවන ලද දායක මුදල් සහ ඒ දායක මුදල් සම්බන්ධයෙන් ඉපයී ඇති පොලිය ද සමඟ ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට පවරනු ලැබිය යුතු අතර එවැනි ගුරුවරයකුට හෝ ඒ ගුරුවරයා මගින් හෝ යටතේ හෝ හිමිකම් ඉදිරිපත් කරන යම් තැනැත්තකුට විශ්‍රාම වැටුප් අරමුදල යටතේ ප්‍රතිලාභවලට වූ හිමිකම අවසන් විය යුතුය.

---

[1] 1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

සන්නද්ධ හමුදා සාමාජිකයන් සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

[1]57ඇ. (1) යම් විශ්‍රාම වැටුප් හිමි රජයේ නිලධරයකු සන්නද්ධ හමුදාවල සමාජිකයකු වීම සහ ඒ අනුව, 1970 අංක 18 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකු වීම සිදු වූ අවස්ථාවක, මේ ආඥාපනත යටතේ ඔහු අරමුදලට දායක වූ කාලසීමාවන්, ඉහත කී පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්‍රාම වැටුප් ක්‍රමයට ඔහු දායක වූ කාල සීමාවන් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, මේ ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ ආඥාපනත යටතේ අරමුදලට ගෙවූ ඔහුගේ කිසිම දායක මුදලක් ආපසු නොගෙවිය යුතු ය.

(2) යම් විවාහක රජයේ නිලධරයකු සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වූ අවස්ථාවක, මේ ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට දායකවීම දිගටම කරගෙන යාම සඳහා ඒ නිලධරයාට කැමැත්ත හෝ අකමැත්ත පළ කිරීමට හැකි විය යුතු අතර ඔහු සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වීමෙන් හය මසක් ඇතුළත ඒ කැමැත්ත හෝ අකමැත්ත පළ කළ යුතු ය. මේ ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට දායකවීම දිගටම කරගෙන යාම සඳහා ඒ නිලධරයා කැමැත්ත පළ කරන අවස්ථාවක, ඒ නිලධරයා සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

1906 මාර්තු 14 වන දිනට පසුව පත් කරනු ලැබූ නිලධරයන් සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බව.

57ඉ. 1906 මාර්තු 14 වන දිනට පසුව පත් කරනු ලැබූ රජයේ නිලධරයන් සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ ගෙවිය යුතු සියලුම විශ්‍රාම වැටුප් සහ ඒ නිලධරයන්ට හෝ ඔවුන්ගේ නීත්‍යානුකූල නියෝජිතයන්ට හෝ උරුමක්කරුට හෝ උරුමක්කරුවන්ට මේ ආඥාපනත යටතේ ආපසු ගෙවිය යුතු සියලුම මුදල් හා ගෙවිය යුතු සියලුම පොලී ප්‍රමාණයන් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර ඒවා මෙයින් ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබේ.

මේ ආඥාපනතේ 57අ වගන්තියේ විධිවිධාන හැර අනෙක් විධිවිධාන යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සියයට විසි පහකින් වැඩි කළ යුතු බව.

57ඊ. අදාළ දිනයේ දී හෝ ඒ දිනට පසු ආරම්භ යම් කාලසීමාවක් සඳහා (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් 57අ වගන්තිය යටතේ ගණන් බලනු ලැබූ විශ්‍රාම වැටුප් නොවන) මේ ආඥාපනත යටතේ වැන්දඹුවන්ට හෝ අනත්දරුවන්ට ලැබිය යුතු සියලු විශ්‍රාම වැටුප්, සන්තකයේ ඇත්තේ වුව ද, අපේක්ෂා කරනු ලබන්නේ වුව ද එමෙන්ම ආපසු ලබන්නේ වුව ද, සියයට විසි පහකින් වැඩි කරනු ලැබිය යුතු ය.

53 වන වගන්තියේ සඳහන් රජයේ නිලධරයන් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමය පිළිබඳ ජීවන ගණක විමර්ශනය.

58. 53 වන වගන්තියේ සඳහන් රජයේ නිලධරයන් සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමය පිළිබඳ විමර්ශනයක් ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි කාලවල දී, ජනාධිපතිවරයා විසින් අනුමත කරනු ලබන ජීවන ගණකවරයකු විසින් කරනු ලැබිය යුතු ය..

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ යම් විධිවිධානයක " අග්‍රාණ්ඩුකාරවරයා" යන වචනය යෙදෙන කවරම අවස්ථාවක හෝ වුව ද, ඒ වෙනුවට "අමාත්‍යවරයා" යන වචනය ආදේශ කරනු ලැබේ.

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ යම් විධිවිධානයක " අධ්‍යක්ෂවරයන්" යන වචනය යෙදෙන නවරම අවස්ථාවක හෝ වුව ද, ඒ වෙනුවට " අධ්‍යක්ෂවරයා" යන වචනය ආදේශ කරනු ලැබේ. තව ද, ඒ අනුව, ඒ අධ්‍යක්ෂවරයන්ගේ යම් කෙනෙකු හෝ වැඩි දෙනෙකු හෝ සියල්ලන්ම විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ ඉටු කරනු ලබන බලතල කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් සම්බන්ධයෙන් ඒ ප්‍රඥප්තියේ කෙරෙන යම් සඳහන් කිරීමක්, අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ ඉටුකරනු ලබන යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් සම්බන්ධයෙන් කෙරෙන සඳහන් කිරීමක් වශයෙන් කියවා තේරුම්ගත යුතුය.

[1]1981 ජූලි මස 03 වැනි දින 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත.

I වන උපලේඛනය

II වන උපලේඛනයේ වගු අනුව, රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවනට හා අනාථ දරුවනට විශ්‍රාම වැටුප් ගණනය කිරීමට ව්‍යවස්ථා

ව්‍යවස්ථා වල සාරාංශය

(ඒ) අවිවාහක සමයේදී දායකවීම අරඹන රාජ්‍ය නිලධාරියා

I. පළමුවන භාර්යාවට ලැබිය හැකි විශ්‍රාම වැටුප

(අ) අවිවාහක සමයේදී ගෙවන ලද දායක මුදල අනුව දෙන විශ්‍රාම වැටුප.

(ආ) විවාහය සිදුවූ දිනයේදී පැවති වාර්ෂික දායක මුදල අනුව දෙන විශ්‍රාම වැටුප.

(ඇ) දායකයා ප්‍රථම භාර්යාව සමඟ විවාහ වී සිටි අවධියේ ජංගම වාර්ෂික දායක මුදලේ අඩු වැඩි වීම් නිසා විශ්‍රාම වැටුපේ සිදුවන වෙනස්වීම්.

II. දෙවන හා තදනන්තර භාර්යාවක විසින් ලැබිය හැකි විශ්‍රාම වැටුප

(අ) දායකයා වැන්දඹු පුරුෂයෙකුව සිටි අවධියේ ජංගම වාර්ෂික දායක මුදලේ අඩුවීම් හා වැඩිවීම් නිසා විශ්‍රාම වැටුපෙහි සිදුවන වෙනස්වීම්.

(ආ) දායකයා විවාහ වීම නිසා විශ්‍රාම වැටුපේ ඇතිවන වෙනස්වීම්.

(ඇ) දායකයා දෙවන හෝ තදනන්තර භාර්යාවක හා විවාහ වීම නිසා ජංගම වාර්ෂික දායක මුදලේ අඩුවීම් හා වැඩිවීම් අනුව විශ්‍රාම වැටුපෙහි සිදුවන වෙනස්වීම්.

(බී) විවාහක සමයේ දායක මුදල් ගෙවීම අරඹන රාජ්‍ය නිලධාරියා

III. ප්‍රථම භාර්යාව විසින් ලැබිය හැකි විශ්‍රාම වැටුප

(අ) දායකකම අරඹන දින ජංගම වාර්ෂික දායක මුදල අනුව දෙන විශ්‍රාම වැටුප.

(ඇ) දායකයා ප්‍රථම භාර්යාව සමඟ විවාහ වී සිටි අවධියේ ජංගම වාර්ෂික දායක මුදලේ අඩුවීම් හා වැඩිවීම් අනුව විශ්‍රාම වැටුපෙහි සිදුවන වෙනස්වීම්.

IV.දෙවන හා තදනන්තර භාර්යාවක විසින් ලැබිය හැකි විශ්‍රාම වැටුප

(අ) දායකයා වැන්දඹු පුරුෂයෙකුව සිටි අවධියේ ජංගම වාර්ෂික දායක මුදලේ අඩුවීම් හා වැඩිවීම් අනුව විශ්‍රාම වැටුපෙහි සිදුවන වෙනස්වීම්.

(ආ) දායකයා නැවත විවාහ වීම නිසා විශ්‍රාම වැටුපෙහි සිදුවන වෙනස්වීම්.

(ඇ) දායකයා දෙවන හෝ තදනන්තර භාර්යාවක හා විවාහ වී සිටි අවධියේ ජංගම වාර්ෂික දායක මුදලේ අඩුවීම් හා වැඩිවීම් අනුව විශ්‍රාම වැටුපෙහි සිදුවන වෙනස්වීම්.

(සී) වැන්දඹු පුරුෂයෙකු සිටි අවධියේ දායක මුදල් ගෙවීම අරඹන රාජ්‍ය නිලධාරියා

V. දෙවන හා තදනන්තර භාර්යාවක විසින් ලැබිය හැකි විශ්‍රාම වැටුප

(ඩී) අනාථ දරුවන්ගේ විශ්‍රාම වැටුප්

VI. වැන්දඹු පුරුෂයාගේ මරණයේ දී අනාථ දරුවන්ගේ විශ්‍රාම වැටුප

(අ) එකම භාර්යාවගේ දරුවන්

(ආ) වෙනස් භාර්යාවන්ගේ දරුවන්

VII. වැන්දඹුවක් දෙවන වර විවාහ වීම නිසා හෝ මිය යාම නිසා අනාථ වන දරුවන්ගේ විශ්‍රාම වැටුප.

VIII. විවාහක දායකයෙකු මියයාමේදී අනාථවන දරුවන්ගේ විශ්‍රාම වැටුප.

(ඊ) <u>වෙනත් විජිතයක සේවයට මාරුකළ රාජ්‍ය නිලධාරියා</u>

(එෆ්) <u>වගු වල දක්වා නැති වයස් ප්‍රමාණයක් සඳහා මාත්‍රා ගණනය කිරීම - (වගුවල ප්‍රතිඵල)</u>

<u>ඒ සිට සී දක්වා - ලේඛනගත විශ්‍රාම වැටුප සෙවීම</u>

දායකයෙකුගේ මරණය සිදුවූ විට ගෙවිය යුතු හෝ ගෙවීමට සිදුවිය හැකි විශ්‍රාම වැටුප ගණනය කිරීම ඔහු මිය යන තෙක්ම පමා නොකළ යුත්තේය. ඒ වෙනුවට සෑම දායකයෙකු පිළිබඳ පූර්ණ විස්තර ඇතුලත් ලේඛනයක් කල් ඇතුව සාදා තැබිය යුතු වන අතර එම ලේඛනයෙහි විවාහක හෝ වැන්දඹු දායකයෙකු විශ්‍රාම වැටුප් ලැබිය යුතු වැන්දඹුවක හෝ අනාථ දරුවන් සිටියදී මිය ගිය මොහොතකදීම ගෙවීමට සිදුවිය හැකි විශ්‍රාම වැටුපේ ප්‍රමාණය දැක ගත හැකි පරිදි එක් එක් දායකයාගේ නම ඉදිරියෙහි සටහන් කොට තැබිය යුත්තේය. දායකයෙකුගේ නම ඉදිරියෙහි එසේ සටහන් කොට තබන වර්ෂයකට ගෙවිය හැකි විශ්‍රාම වැටුප - පහත දැක්වෙන නීති අනුව ගණනය කළ යුත්තේය.

<u>ඒ- අවිවාහක සමයේ දායකකම ඇරඹූ රාජ්‍ය නිලධාරියා</u>

(සටහන - අවිවාහක දායකයෙකු විවාහ වන තෙක් ලේඛන ගත විශ්‍රාම වැටුප ලේඛනයෙහි සටහන් නොකළ යුත්තේය.)

I. ප්‍රථම භාර්යාව විසින් ලැබිය හැකි විශ්‍රාම වැටුප

(සටහන - පහත දැක්වෙන I (අ) සහ I (ආ) නීති අනුව ගණනය කළවිට ලැබෙන ප්‍රමාණයන් දෙක එකතු කිරීමෙන් විවාහය සිදුවූ විට සටහන් කළ යුතු ලේඛනගත විශ්‍රාම වැටුප සොයා ගත හැක්කේය. )

(අ) අවිවාහක සමයේ ගෙවූ දායක මුදල අනුව දෙනු ලබන විශ්‍රාම වැටුප

නීතිය I (අ) - සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වන දින වන විට ලැබී ඇති සියළු දායක මුදල්වලට වර්ෂයට සියයට හයේ වැල් පොලිය එකතු කිරීමෙන් ලැබෙන උත්තරය, විවාහය සිදුවූ දිනය ළඟට එළඹෙන උපන් දිනයේදි සැමියාගේ හා බිරිඳගේ වයස් වලට අනුරූපව “ ඒ” වගුවේදී ඇති මාත්‍රාවෙන් ගුණකල විට අවිවාහක සමයේදී ගෙවා ඇති දායක මුදල අනුව ගෙවිය යුතු ලේඛනගත විශ්‍රාම වැටුප ලැබෙන්නේය.

(ආ) විවාහය සිදුවූ දිනය වන විට පැවති වාර්ෂික දායක මුදල අනුව දිය යුතු විශ්‍රාම වැටුප.

(සටහන - අන්තිම මාසයේ දායක මුදල 12 න් ගුණකිරීමෙන් ජංගම වාර්ෂික දායක මුදල සොයා ගත හැක්කේය.)

නීතිය I (ආ) – 13 වගුවෙහි දායක මුදල් ගෙවීමේ කාල පරිච්ඡේදය අවසක් වන දිනයේ දී ස්වාමි පුරුෂයාගේ වයස යන සිරස්තලයෙන් යුත් කොටසෙහි විවාහය සිදුවූ දින ළඟට එළඹෙන උපන්දිනයන්හිදී ස්වාමි පුරුෂයාගේ හා භාර්යාවගේ වයසට අනුරූපව දී ඇති මාත්‍රාවෙන්

දායක මුදල ගුණකළ විට ලැබෙන ගණිතය වූ කලී විවාහය වූ දිනයේ ජංගම වාර්ෂික දායක මුදල වෙනුවෙන් ලැබෙන ලේඛනගත විශ්‍රාම වැටුප වන්නේය.

<u>නීති අංක I(අ) සහ I (ආ) - නිදසුන් :-</u>

නිලධාරියාගේ උපන්දිනය 1858.07.31

ඔහු දායකකම ඇරඹූ දිනය 1884.01.01

ඔහු විවාහ වූ දිනය 1888.06.30

1884 .04.30 සිට 1886.12.31 දක්වා වාර්ෂික දායක මුදල රු: 20.00

1887.01.01 සිට 1888.06.30 දක්වා වාර්ෂික දායක මුදල රු: 30.00

දායක මුදල් ගෙවීම අවසන් වූ දිනය 1919.04.01

භාර්යාවගේ උපන්දිනය 1868.08.31

විවාහයේ දිනය ළඟම උපන්දිනයට නිලධාරියාගේ වයස අ: 30

දායක මුදල් ගෙවීම අවසන් වූ දිනය පසුව ළඟම

එළඹෙන උපන් දිනයේ දි නිලධාරියාගේ වයස අ: 61

විවාහ වූ දිනට ලඟම එළඹෙන උපන් දිනයේදී

භාර්යාවගේ වයස අ: 20

<u>I (අ) නීතිය යෙදෙන අන්දම :-</u>

අවිවාහක සමයේ ගෙවූ දායක මුදල :-

| | |
|---|---|
| 1884.04.01 – 1888.12.31 දක්වා මුදල | රු: 15.00 |
| 1885 වර්ෂය තුළ මුදල | රු: 20.00 |
| රු: 15/= ට වර්ෂයක පොලිය 6% | <u>රු: 00.90</u> |
| | 35.90 |
| 1886 වර්ෂයේ දායක මුදල | රු: 20.00 |
| රු: 35.90 ට පොලිය 6% බැගින් | <u>රු: 2.15</u> |
| | රු: 58.05 |
| 1887 දායක මුදල | රු: 30.00 |
| රු. 58.05 ට පොලිය 6% බැගින් | <u>රු. 3.48</u> |
| | රු. 91.53 |
| 1888.01.01 සිට 1888.06.30 දායක මුදල | රු. 15.00 |
| රු.91.53 ට පොලිය 6% බැගින් | <u>රු. 2.75</u> |
| එකතුව | <u>රු.109.28</u> |

ඒ වගුව අනුසාරයෙන් මාත්‍රාව :-

| | | |
|---|---|---|
| සැමියා | 30 | .346 |
| බිරිඳ | 20 | |

එම නිසා අවිවාහක සමයේ ගෙවූ දායක මුදලට ලැබිය යුතු ලේඛනගත

විශ්‍රාම වැටුප = රු: 109.28 x .346 = රු: 37.81 යි.

I (ආ) නීතිය යෙදෙන අන්දම :-

විවාහය දා පැවති වාර්ෂික දායක මුදල රු:30.00

දායක මුදල් ගෙවීම අවසන් වීමෙන් පසු එළඹෙන උපන් දිනට වයස අවු: 61 සම්පූර්ණ වන නිලධාරීන්ට අනුරූප බී වගුවේ සඳහන් මාත්‍රාව :

| | | |
|---|---|---|
| සැමියා | 30 | 4.29 |
| බිරිය | 20 | |

විවාහය දා පැවති වාර්ෂික දායක මුදල අනුව ලේඛනගත විශ්‍රාම වැටුප = රු: 30 x 4.29 = රු:128.70

විවාහය සිදු වූ දා සටහන් කළ යුතු

| | |
|---|---|
| ලේඛනගත විශ්‍රාම වැටුප I (අ) නීතිය යටතේ | රු: 37.81 |
| I (ආ) නීතිය යටතේ | රු: 128.70 |
| එකතුව | රු: 166.51 |

(ඇ) දායකයා පළමුවන බිරිය හා විවාහ වී සිටි කාලය තුළ පැවති වාර්ෂික දායක මුදලේ වැඩිවීම් හා අඩුවීම් අනුව විශ්‍රාම වැටුපෙහි ඇතිවන වෙනස්වීම්.

සටහන - දායක මුදල් ගෙවීමේ සම්පූර්ණ කාල සීමාව අවසන් වීමට පෙර දායක මුදල් ගෙවීම නතරවීමෙහි ප්‍රතිඵලය වන්නේ ජංගම වාර්ෂික දායක මුදලට සමාන මුදලකින් වාර්ෂික දායක මුදල අඩුවීමයි.

I (ඇ) නීතිය - 13 වගුවෙහි දායක මුදල් ගෙවීමේ කාල පරිච්ඡේදය අවසන් වන දිනට ස්වාමි පුරුෂයාගේ වයස යන සිරස්තලයෙන් යුත් කොටසෙහි ජංගම වාර්ෂික දායක මුදලේ වැඩිවීම් හෝ අඩුවීම් හෝ, දායක මුදලේ වෙනස්වීමක් සිදුවූ දිනට පසුව එළඹෙන උපන්දිනයේදී ස්වාමිපුරුෂයාගේ හා භාර්යාවගේ වයස් වලට අනුරූපව දී ඇති මාත්‍රාවෙන් ගුණ කළ විට ලැබෙන ගුණිතය ලේඛනගත විශ්‍රාම වැටුපට එකතු කළ යුතු ජංගම වාර්ෂික දායක මුදලේ වැඩිවීම හෝ ලේඛනගත විශ්‍රාම වැටුපෙන් අඩුකළ යුතු ජංගම වාර්ෂික දායක මුදල් අඩුවීම වන්නේය.

I (ඇ) නීතිය යෙදෙන අන්දමට නිදසුන් :-

I (අ) හා I (ආ) නීතිවල දැක් වූ විස්තරම මෙහිදි ද ගනිමු.

1893 මැයි 31 වන දින වාර්ෂික දායක මුදල රු: 30.00 සිට රු: 50.00 දක්වා වැඩි කරන ලදි.

1898 අප්‍රේල් 30 වන දින සිට රු: 50.00 සිට රු: 40.00 දක්වා අඩුකරන ලදි.

1903 මාර්තු 31 වන දින වාර්ෂික දායක මුදල් ගෙවීම නතර විය.

1893 මැයි 31 වන දින ජංගම වාර්ෂික මුදල රු: 20.00 කින් වැඩිවිය.

දායක මුදල් ගෙවීමේ කාලය අවසන් වී එළඹෙන උපන් දිනට වයස අවු: 61 සම්පූර්ණ වන නිලධාරීන්ට බී වගුවේ අනුරූප කොටසේ සඳහන් මාත්‍රාව :

| | | |
|---|---|---|
| ස්වාමි පුරුෂයා | 35 | 3.56 |
| භාර්යාව | 25 | |

ඒ අනුව ලේඛනගත විශ්‍රාම වැටුපට එකතු කළ යුතු මුදල = රු: 20 x 3.56 = රු: 71.20

විවාහය දවසේ පැවති ලේඛනගත විශ්‍රාම වැටුප I (අ) සහ I (ආ)

| | |
|---|---|
| නීතිවල උදාහරණය අනුව | රු: 166.51 |
| එකතු කළා | රු: 71.20 |
| 1893 මැයි 31 වන දින විශ්‍රාම වැටුප | රු: 237.71 |

1898 අප්‍රේල් 30 - ජංගම වර්ෂයේ දායක මුදලේ අඩුවීම රු: 10.00 යි. දායක මුදල් ගෙවීමේ කාලය කාලය අවසන් වී එළඹෙන උපන් දිනයට වයස අවුරුදු 61 සම්පූර්ණ වන නිලධාරීන්ට බී වගුවේ අනුරූප කොටසේ මාත්‍රාව :-

| | | |
|---|---|---|
| ස්වාමි පුරුෂයා | 40 | 2.91 |
| භාර්යාව | 30 | |

ඒ අනුව ලේඛනගත විශ්‍රාම වැටුපෙන් අඩුකළ යුතු මුදල = රු: 10 x 2.91 = 29.10

| | | |
|---|---|---|
| 1893 මැයි 31 විශ්‍රාම වැටුප | = | රු: 237.71 |
| අඩුකළා | = | රු: 29.10 |
| 1898 අප්‍රේල් මස 30 වන දිනට ලේඛනගත විශ්‍රාම වැටුප | | රු: 208.60 |

1903 මාර්තු 31 - දායක මුදල් ගෙවීම නතර කිරීම ජංගම

වර්ෂයේ අඩුවීමක් ලෙස සැලකීම රු: 40.00

දායක මුදල් ගෙවීමේ කාලය අවසන් වී එලඹෙන උපන් දිනය වයස 61

සම්පූර්ණ කළ නිලධාරීන්ට අනුරූප බී වගුවේ මාත්‍රාව

| | | |
|---|---|---|
| ස්වාමි පුරුෂයා | 45 | 2.30 |
| භාර්යාව | 35 | |

| | |
|---|---|
| ලේඛනගත විශ්‍රාම වැටුපෙන් අඩුකළ යුතු මුදල රු: 40 x 2.30 | = රු: 92.00 |
| ( ඉහතින් දැක් වූ ) 1893 අප්‍රෙල් 30 ට ලේඛනගත විශ්‍රාම වැටුප | = රු: 208.61 |
| අඩු කල යුතු මුදල | = රු: 92.00 |
| 1893 මාර්තු 31 දින ලේඛනගත විශ්‍රාම වැටුප | = රු: 116.61 |

## II දෙවන හා තදනන්තර භාර්යාවකට ලැබිය හැකි විශ්‍රාම වැටුප

සටහන - (අ) ජංගම වාර්ෂික දායක මුදලේ වැඩිවීමක් නිසා හෝ අඩුවීමක් නිසා හෝ විශ්‍රාම වැටුපේ සිදුවන වෙනස්කම්.

II (අ) ව්‍යවස්ථාව - දායක මුදලේ වෙනස් වීම සිදුවන දිනය වන විට පළමුවන බිරිය ජීවත්ව සිටියේ නම් එදින ඇගේ වයසට සමාන වයසේ බිරියන් සමඟ නිලධාරියා විවාහයක් කර ගත් සේ සළකමින් I (ඇ) නීතිය යටතේ මෙහිදී ද ක්‍රියා කළ යුත්තේ ය.

II (අ) ව්‍යවස්ථාවට නිදසුන් :-

1868 උපන් ප්‍රථම භාර්යාව මිය යාම හැර අනෙක් සියළු විස්තර I (ඇ) නිදසුනේ විස්තර හා සමාන යැයි සලකා දියක මුදලේ සිදු වූ වෙනස්වීම් තුනෙහිදීම ඔහු 1868 දී උපන් බිරිය හා විවාහ වී සිටියේ යයි ගනිමු. එවිට I (ඇ) නිදසුනෙහි දක්වා ඇති ගණනය කිරීමේ පිලිවෙල මෙහිදී ද ඒ ආකාරයෙන් ම යෙදිය යුත්තේය.

<u>(ආ) දායකයා නැවත විවාහවීම නිසා විශ්‍රාම වැටුපපෙහි සිදුවන වෙනස්වීම් :-</u>

සටහන - දෙවන හෝ තදනන්තර භාර්යාවක සමඟ විවාහ වන විට ඇගේ වයස හා ප්‍රථම භාර්යාව ජීවත්ව සිටියේ නම් ඇගේ ඊළඟ උපන් දින වන විට ඇගේ වයස සමාන නම් ලේඛනගත විශ්‍රාම වැටුපෙහි වෙනසක් සිදු නොවේ.

II (ආ) ව්‍යවස්ථාව - දායකයා නැවත විවාහ වුවහොත් එදිනට, දෙවන හා තදනන්තර භාර්යාවන්ගේ වයස, පළමු භාර්යාවගේ ඊළඟ උපන්දිනයේදී වයසට අඩු හෝ වැඩි වන්නේ නම් ලේඛනගත විශ්‍රාම වැටුප ස්වාමි පුරුෂයා යලි විවාහ වූ දිනට පසුව එළඹෙන උපන් දිනයේදී ඔහුගේ වයසට සහ මිය ගිය භාර්යාවගේ ඊළඟ උපන් දිනයේදි ඇගේ වයසට අනුරූපව සී වගුවේ දී ඇති මාත්‍රාවෙන් ගුණකොට ලැබෙන ගුණිතය යලි විවාහය වූ දිනයේ දෙවන හෝ තදනන්තර භාර්යාවගේ වයසට හා ස්වාමි පුරුෂයාගේ වයසට අනුරූපව ඒ වගුවේ දි ඇති මාත්‍රාවෙන් ගුණ කරන්න. එවිට ලැබෙන්නේ දායකයා යලි විවාහ වූ දිනට ඔහුගේ ලේඛනගත විශ්‍රාම වැටුප ය.

II (ආ) නීතියට නිදසුන් :-

I(අ) හා I (ආ) ව්‍යවස්ථා වලට දැක්වූ නිදසුන්වල විස්තර මෙහිදී ද ගනිමු.

පළමු භාර්යාව මිය ගිය දිනය 1888. නොවැ. 30

දායකයා යලි විවාහ වූ දිනය 1893. ජන.31

දායකයා යලි විවාහ වූ දිනට පසුව එළඹෙන උපන්දින ඔහුගේ වයස අවු: 35

දෙවන භාර්යාවගේ උපන්දිනය 1873. ජුනි. 30

විවාහ වූ දිනට පසුව එළඹෙන උපන්දිනට ඇගේ වයස අවු: 20

දෙවන විවාහය සිදු වූ දිනට පසුව එළඹෙන උපන්දිනට (ප්‍රථම බිරිය ජීවත්ව සිටියේ නම්)

ප්‍රථම භාර්යාවගේ වයස අවු: 25

1893 ජනවාරි 31 යලි විවාහය සිදු වන විට දෙවන භාර්යාවගේ වයස පළමු භාර්යාවගේ

(ජීවත්ව සිටියේ නම්) වයසට අඩුවීම නිසා ලේඛනගත විශ්‍රාම වැටුප වූ රු: 166.51 යලි ගණනය කළ යුත්තේය. (I) (අ) හා I (ආ) නිදසුන් බලන්න.

සී වගුවෙන් ලද මාත්‍රාව ස්වාමි පුරුෂයා - 35 } 3.224

| | | | |
|---|---|---|---|
| | භාර්යාව | - 25 | |
| ඒ වගුවෙන් ලද මාත්‍රාව | ස්වාමි පුරුෂයා | - 35 | .293 |
| | භාර්යාව | - 20 | |

1893 ජනවාරි 31 දිනට ලේඛනගත විශ්‍රාම වැටුප = රු. 166.51 x 3.224

= 536.83

රු.536.83 x .293 = රු. 157.29

(ඇ) දායකයා දෙවන හෝ තදනන්තර භාර්යාවක සමඟ විවාහ වීම හේතු කොටගෙන ජංගම වාර්ෂික දායක මුදලේ වැඩිවීම හෝ ජංගම වාර්ෂික දායක මුදලෙන් අඩුවීම නිසා විශ්‍රාම වැටුපෙහි සිදුවන වෙනස්වීම්.

II (ඇ) ව්‍යවස්ථාව - I (ඇ) ව්‍යවස්ථාවේ පරිදි ක්‍රියා කළ යුතුය.

බී. <u>විවාහ වීමෙන් පසුව දායකවීම අරඹන රාජ්‍ය නිලධාරියා</u>

III පළමුවන භාර්යාව විසින් ලැබිය හැකි විශ්‍රාම වැටුප.

සටහන - විවාහ වීමෙන් පසු දායකවීම අරඹන රාජ්‍ය නිලධාරීන් සියළුදෙනාගේ එවකට සිටින භාර්යාවන් පළමුවන භාර්යාවන් සේ සළකනු ලැබේ. පූර්ව භාර්යාවන් ගෙන්, විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ සිටින යම් භාර්යාවක් පිළිබඳ ප්‍රශ්නයක් පැන නගින්නේ නැත්නම් මිස ඔවුන් පිළිබඳ කිසිවක් සටහන් නොකළ යුතුය.

(ඩී - අනාථ දරුවන්ට විශ්‍රාම වැටුප් බලන්න)

(අ) දායක මුදල් ගෙවීම ඇරඹූ දා පැවති වාර්ෂික දායක මුදල අනුව ගෙවිය යුතු විශ්‍රාම වැටුප

III (අ) නීතිය - බී වගුවේ, දායක මුදල් ගෙවීමේ කාලය අවසන් වන දිනට ස්වාමිපුරුෂයාගේ වයස යන සිරස්තලයෙන් යුතු කොටස බලන්න. එහි ස්වාමිපුරුෂයාගේ හා භාර්යාවගේ ඊළඟ උපන් දිනය වයසට අනුරූප ව දී ඇති මාත්‍රාවෙන් ජංගම වාර්ෂික දායක මුදල ගුණ කරන්න. ඉන් ලැබෙන ගුණිතය වන්නේ දායකවීම ඇරඹූයේ දිනයේ පැවති වාර්ෂික දායක මුදල අනුව ලැබිය හැකි විශ්‍රාම වැටුපයි.

III (අ) ව්‍යවස්ථාවට නිදසුන් -

| | |
|---|---|
| නිලධාරියාගේ උපන්දිනය | 1850.08.31 |
| නිලධාරියා විවාහ වූ දිනය | 1879.06.30 |
| නිලධාරියා දායකවීම ඇරඹූ දිනය | 1890.07.31 |
| 1890.07.31 දින පැවති වාර්ෂික දායක මුදල | රු. 100.00 |
| දායක මුදල් ගෙවීම අවසන් වන දිනය | 1910.08.31 |
| භාර්යාවගේ උපන්දිනය | 1860.10.31 |

1890.07.31 ට නිලධාරියාගේ වයස අවුරුදු: 40

දායක මුදල් ගෙවීම අවසන් වන දිනට වයස අවුරුදු: 65

1890.07.31 ට භාර්යාවගේ වයස අවු : 30

1890.07.31 ජංගම වාර්ෂික දායක මුදල රු. 100.00

දායක මුදල් ගෙවීම අවසන් වන දිනට පසුව එළඹෙන උපන්දින දායකයාගේ

වයස 65 නිලධාරීන්ට අදාළ බී වගුවේ කොටස අනුව මාත්‍රාව

| | | |
|---|---|---|
| ස්වාමි පුරුෂයා | 40 | 3.07 |
| භාර්යාව | 37 | |

II (ඇ) ව්‍යවස්ථාව - I (ඇ) ව්‍යවස්ථාවේ පරිදි ක්‍රියා කළ යුතුය.

දායක මුදල් ගෙවීම අරඹන දින කැමති වාර්ෂික දායක මුදල අනුව ලැබිය යුතු

ලේඛන ගත විශ්‍රාම වැටුප = 100 x 3.07 = රු. 307.00

(ආ) පළමු විවාහය සමයේදී දායක මුදල් ගෙවීම ආරම්භ කරන අයිතියෙකුගේ වාර්ෂික දායක මුදලේ වැඩිවීම හා අඩුවීම් නිසා විශ්‍රාම වැටුප තුල ඇතිවන වෙනස්කම්

III (ආ) ව්‍යවස්ථාව I (ඇ) නීතිය අනුවම කටයුතු කරන්න.

IV <u>දෙවන හා තදනන්තර භාර්යාවකගේ විසින් ලැබිය හැකි විශ්‍රාම වැටුප</u>

සටහන - දායකයා වැන්දඹු පුරුෂයෙකුව සිටියදී ජංගම වාර්ෂික දායක මුදලේ වැඩිවීම් නිසා හෝ අඩුවීම් නිසා හෝ විශ්‍රාම වැටුපෙහි සිදුවන වෙනස්කම්.

IV (අ) – II (අ) ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරන්න.

(ආ)- දායකයා යලි විවාහ වීම නිසා විශ්‍රාම වැටුප වෙනස් වන්නේය.

IV (ආ) – II (ආ) ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරන්න.

(ඇ) දායකයා දෙවන හා තදනන්තර භාර්යාවක සමඟ විවාහ වී සිටියදී ජංගම වාර්ෂික දායක මුදලේ වැඩිවිම් හා අඩුවීම් නිසා හෝ ලැබිය යුතු විශ්‍රාම වෙනස් විය හැක්කේය.

V (ඇ) ව්‍යවස්ථාව - I (ඇ) ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරන්න.

සී <u>වැන්දඹු පුරුෂයෙකුව සිටියදී දායක මුදල් අරඹන රාජ්‍ය නිලධාරියා</u>

V දෙවන හා තදනන්තර භාර්යාවකගේ විශ්‍රාම වැටුප

V ව්‍යවස්ථාව - ලේඛනගත විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී දායක මුදල් ගෙවීම ආරම්භ වන තුරුම, මිය ගිය භාර්යාව සිටියායැයි සළකා, විවාහක සමයෙහිදී දායකවීම ඇරඹු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා කළ නීති අනුව කටයුතු කළ යුතුය. (බී බලන්න)

ඩී <u>අනාථ දරුවනට විශ්‍රාම වැටුප්</u>

VI වැන්දඹු දායකයෙකු මිය ගිය විට අනාථ දරුවන්ගේ විශ්‍රාම වැටුප්

(අ) එකම භාර්යාවගේ දරුවන් වූ කල.

VI (අ) ව්‍යවස්ථාව - විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ඇති එවකට සිටින දරුවන් අතර දායකයාගේ ලේඛනගත විශ්‍රාම වැටුප සමසේ බෙදා දිය යුතුය.

VI (ආ) ව්‍යවස්ථාව - නිදසුන් -

වැන්දඹු දායකයා මිය යන විට ඔහුගේ වාර්ෂික ලේඛනගත විශ්‍රාම වැටුප රු : 150.00 කි.

ඔහුගේ ඇවෑම හිමි දරුවන් :-

| | |
|---|---|
| අවිවාහක දියණිය | වයස අවු: 19 |
| පුතා | වයස අවු: 14 |
| පුතා | වයස අවු: 12 |

එක් එක් දරුවා වාර්ෂිකව රු. 50.00 ක විශ්‍රාම වැටුපක් ලැබිය යුත්තේය.

අවිවාහක දියණිය වයස 20 දී විවාහ වුවහොත් එතැන් සිට පුතුන් දෙදෙන වාර්ෂිකව රු. 75/= බැගින් ලැබිය යුතුය.

වයස 15 දී බාලම පුතා මිය ගියේ නම් වැඩිමහල් පුතා රු. 150/= ම ලබයි.

(ආ) වෙනත් වෙනත් භාර්යාවන්ගේ දරුවන් වූ කල:

සටහන - මෙහි දැක්වෙන නීති භාර්යාවන් දෙදෙනෙකු සඳහා පමණි.

VI (ආ) ව්‍යවස්ථාව - (1) ස්වාමි පුරුෂයාගේ මරණය පසුව ද වැන්දඹුව ජීවත්ව සිටී නම් ඇයට ලැබිය හැකි විශ්‍රාම වැටුපෙන් අර්ධයක් එවකට විශ්‍රාම වැටුප් ලැබිය යුතු දරුවන් අතරේ සමසේ බෙදා දිය යුතුය.

(2) ස්වාමි පුරුෂයාගේ මරණයෙන් පසුව ද දෙවන භාර්යාව ජීවත්ව සිටී නම් හා පළමුවන භාර්යාවගේ දරුවන් පිළිබඳ ගැටළුවක් නැත්තේ නම් , දෙවන භාර්යාවට හිමි විශ්‍රාම වැටුපෙන් අර්ධයක් එවකට විශ්‍රාම වැටුප් හිමි ඇගේ දරුවන් අතර සමසේ බෙදා දිය යුතුය.

